HNB GRAMEEN

# මෙහෙවර

අඳුර දුරලන සොඳුරු මෙහෙවර

2016 ඔක්තෝබර් - නොවැම්බර් කලාපය





## දිවි සයුර තරණය කරන්නට අපි ඔබට අත්වැලක් වන්නෙමු..





## ජීවිතයට අරුතක්



# දෙපයෙන් ගුවන් යානය පදවන ඇය

**ජෙසිකා කොක්ස් ඇයගේ නමයි. ඇය මෙලොව උපත ලැබූවේම තමන්ගේ දෑත අහිමිවයි. එනම් ඇය මෙලොව එළිය දුටුවේ අංග විකල ළදැරියක ලෙසයි.**

ඇයගේ මව ඇයට කුඩා කල සිටම නොමඳ සහයක් දුන් සහායිකාව, මිතුරිය විය. ඒ වගේම ඇගේ පියා කිසිදු විටෙකවත් ඇයගේ දෑත් නොමැති බව සිතමින් කඳුලු සැලුවේ නැත. දුක් වූවේ නැත. තම දරුවාට මව සහ පියා නිරතුරුවම ආදරය, කරුණාව දක්වමින් ඇයට ධෛර්යය, වීර්යය, ශක්තිය ලබාදුනි. ඇයගේ සිතට නිරතුරුවම දැනුනේ, ඇසුනේ ධනාත්මක උපදෙස් සහ මඟ පෙන්වීම් පමණි. එය දරුවාගේ මනස ශක්තිමත් කරලීමට මහත් රුකුලක් විය. අප රටේ බොහෝ දෙමාපියන් තමන්ගේ දරුවන්ගේ ශාරීරික ආබාධ පැවතියහොත් තමාගේ ලැජ්ජාව වසා ගැනීමට දරුවන්ව හංගා තබයි. එසේම ඔවුන්ව මානසිකව වට්ටවයි. එනම් මේකා කාලකණ්ණි දරුවෙක් අපිව නැතිකරන්න ආව දරුවෙක්. අපේ කරුමෙට ඉපදුන එකෙක් ආදි වශයෙන් තම වේදනාව දරුවා වෙතට දමා ගසයි. එමඟින් දරුවාගේ මානසික මට්ටම බිංදුවටම ඇදදමා ධෛර්යය, වීර්යය, ආත්ම ශක්තිය දරුවාගේ හීන කර දමයි. එය දරුවාගේ අනාගත සාර්ථකත්වයට මරු පහරක් බව දෙමාපියන් නොදැන මහා හානියක් දරුවාගේ මනසට සිදු කරයි.



නමුත් ජෙසිකාගේ දෙමාපියන් ඇයට නිරතුරුවම ලබාදුන් ඔවදන වූයේ අනාගතය සාර්ථක කර ගන්නා දේ මිස අහිමි වුණු දෑත් නිසා ජීවිතයට වන අවාසීන් ගැන නොවේ. ඒ නිසාම ඇයත් දෙමාපියනුත් අහිමි වූ දෙඅත් ගැන පසු නොතැවී අනාගතය සාර්ථක කර ගන්නා සැටි ගැන නිරතුරුවම සාකච්ඡා කළෝය. දරුවා ද ඒ පරිසරය මත ධෛර්යය සම්පන්න දේවල් කිරීමට පෙළඹිනි. ඇය අදටත් තම මව හා පියා ගැන කථා කරන්නේ දැඩි ආදරයකින් හා භක්තියකිනි. ඇය එයට හේතු ලෙස පවසන්නේ ඇගේ මව හෝ පියා ඇය මෙලෙස ඉපදීම ගැන කිසිදිනක දුකෙන් හෝ කේන්තියෙන් කථා නොකර ඇති බැවිනි. ජෙසිකා තමන්ගේ දෑත් අහිමි වුව ද අන් දරුවන් මෙන් සියළු ක්‍රිඩාවන් වල නිරත විය. එනම් ඇය ජිම්නාස්ටික්, නර්තනය, හා සිංදු කීම වැනි දේවල් නිසිලෙස සිදුකරන ලදී. ඊට අමතරව පිහිනීම්, වාහන පැදවීම්, පියානෝ වාදනය, සහ ටයි කුන්ඩෝ කරාටේ ක්‍රිඩාව පවා ඇය විසින් ප්‍රගුණ කළා ය. ඇය මෙම දේවල් වලට පාසලෙන් සහ සහභාගි වූ ස්ථාන වලින් ඇගයීම් වලට පවා නිරතුරුවම භාජනය විය. ඇය කළු පටි ශූරී කරාටේ ප්‍රගුණ කළ අයෙකි. ඇය තම වාහනයට කිසිවකුගේ සහයක් නොමැතිව අවශ්‍ය ඉන්ධන සපයා ගැනීම පවා තමා විසින්ම සිදුකර ගනී. එසේම ඇය 2005 වසරේ දී තම විශ්ව විද්‍යාල අධ්‍යාපනය හමාර කර සමාජ විද්‍යා උපාධිය ද හිමිකර ගත්තා ය. එසේම ඇයට නොනිම් ආශාවක් සිත තුළ පැවතිනි. ඒ කිසිවක් නොව දෑත් අහිමි වුවත් ගුවන් යානා පැදවීමේ බලපත්‍රයක් ලබා ගැනීමයි. එසේම ඇය ගුවන් තලයේ නොබියව ගුවන් යානා පැදවීමට ප්‍රවිශ්ඨ වූ අතර ගෙදරින් ඇයට නොමඳ සහයක් ද ලැබිනි. එමඟින් ඇය ඉතා ධෛර්යයෙන් ගුවන් යානා පුහුණු පාඨමාලාවට සහභාගි වී එය අති සාර්ථක ලෙස නිමකරන ලදී. ඇය අවසානයේ ලෝකයේ දෙඅත් අහිමි ප්‍රථම ගුවන් යානා පදවන නියාමකවරිය ලෙස ලෝකයේම සුප්‍රසිද්ධ වූවාය. ඇය ඉහළ අහසේ තම දෙකකුලෙන් ගුවන්යානය හසුරුවන අතර එහි විශාල බැනරයක් ප්‍රදර්ශනය කර තිබූ අතර කාගේත් දෙනෙත් එයට යොමු විය. එහි මෙසේ සටහන් කර තිබුණි. "Look mom, without arms"



''බලන්න අම්මේ දෙඅත් නොමැතිව'' යන්නයි. ඇය ලෝක මව්වරුන්ගේ දින මෙලෙස සිදු කරන ලදී. ඇය ඉතා නිරහංකාර යුවතියකි. ඇය ලොව ප්‍රථම දෑත අහිමි ගුවන් නියමුවරියයි. ලෝකයේ මේ වනතෙක් කිසිවකුත් දෑත් අහිමිව ගුවන් යානා පැදවීමේ බලපත්‍රයක් ලබා ගෙන නොමැත. බොහෝ අය සිතන්නේ සහ කියන්නේ දෑත් අහිමි නිසා කිසිවක් කරකියා ගත නොහැකි බවත් ය. නමුත් ජෙසිකා එවැනි සිතිවිලි ඇය ගැන සිතීමට කිසිදු ඉඩක් ලබා නොදී පිහිනීම, කරාටේ ක්‍රිඩාව, ලිවීම, ගුවන් යානා, වාහන පැදවීම වැනි සාමාන්‍ය අයකු කරන සියළු දේ කිරීමට හැකියාව ලබා ගන්නා ලදී. එසේම ඇය අදවන විට මුළු ලෝකයම දන්නා දිරිය කාන්තාවකි.

ඇය අද වන විට මිනිසුන්ව අභිප්‍රේරණය කරන සුප්‍රසිද්ධ දේශක වරියකි. මින් අපට පැහැදිලි වන කාරණය නම් දෙඅත් අහිමි වුවද ඉලක්ක තබාගෙන අධිෂ්ඨානශීලීව හා ධනාත්මකව කටයුතු කළහොත් ඕනෑම අභියෝගයක් ජයගත හැකි බව ය. ඔබගේ ජීවිතයටත් මෙම ආදර්ශ ලබා ගෙන ජීවිත ඉලක්ක සපුරා ගැනීමට අදිටන් කරගන්න❑



**ප්‍රේමසිරි ගමගේ**
සභාපති, ව්‍යාපාර සංවර්ධන කේන්ද්‍රය.

HNB GRAMEEN මෙහෙවර 03
2016 ඔක්තෝබර් - නොවැම්බර්



## දැන්වීමක කතාවක්

HNB GRAMEEN

# "යාළු එක්ක යාළු වෙන්න"... දැන්වීමට මුල පිරූ හැටි

ළමා ඉතුරුම් ගිණුම



විභාගයෙන් පළමුවැනියා වෙලා සමත් වුණු පුංචි මුණුබුරාට ඔහුගේ දක්ෂතාවය අගයලා රුපියල් සීයේ නෝට්ටුවක් දෙන සීයා කෙනෙකුන් හා ඒ සීයේ කොළය තමන්ගේ අනාගතයට මඟ පෙන්වන ආයෝජනයක් කරගන්න වෙරදරන පුංචි පුතෙක් පිළිබඳ දැන්වීම විද්‍යුත් මාධ්‍යය ඔස්සේ පහුගිය කාලය පුරාම විකාශනය වුණු අපි කාටත් හුරුපුරුදු වෙළෙඳ දැන්වීමක්.

"HNB ග්‍රාමීන් යාළු ළමා ඉතුරුම් ගිණුම, ජනතාව අතරට ගෙනියන්න නිර්මාණය කරපු මේ අපූරු වෙළෙඳ දැන්වීම රූප මාධ්‍යට නැගුණු අයුරු ගැන කතා කරන්න අපි මුණ ගැසුනේ එහි කතා සංකල්පයේ නිර්මාතෘ බුද්ධික දිසානායක මහතාවයි. අපගේ ඉල්ලීමට ඔහුගේ ප්‍රතිචාරය වදන් වලට පෙළ ගැසුනේ මෙහෙමයි.

''HNB ග්‍රාමීන් සමාගම ඔවුන්ගේ යාළු ළමා ඉතුරුම් ගිණුම හඳුන්වාදීම සඳහා වෙළෙඳ දැන්වීමක් නිර්මාණය කරදීමේ කාර්ය අපේ ප්‍රචාරණ ආයතනයට ''රේඩිස් ඇන්ඩ් රෝඩ්ස්'' වෙත භාරදුන් මොහොතේ මට මුලින්ම ඇති වුණේ මේ පණිවිඩය ජනතාව අතරට ගෙන යාමට පාවිච්චි කළ යුතු සංකල්පය කෙබඳු එකක්ද කියන ප්‍රශ්නයයි. එහි දී තවත් තරගකාරී ළමා ගිණුම් රැසක් අතරින් යාළු ළමා ගිණුම සුවිශේෂී එකක් විදිහට ඉස්මතු කිරීමේ අවශ්‍යතාව වගේම ඉන් ලබාදෙන තෑගි පිළිබඳවත් මට කියන්න අවශ්‍ය වුණා.

පුංචි අයට තියෙන විකල්ප රාශියක් අතරින් හොඳම විකල්පය යාළු එක්ක යාළු වෙන බව දැන්වීමේ සමස්ත අර්ථයෙන් කියවෙනවා. අයිස්ක්‍රීම් එකක් කන්න, සෙල්ලම් බඩුවක් ගන්න වගේ අවස්ථා අතහැරලා ඉතුරු කිරීමේ හොඳ පුරුද්දත් එක්ක යාළු වෙන පොඩිත්තන්ට යාළු වෙතින් ලැබෙන ප්‍රතිලාභ වලට අමතරව වටිනා තෑගිත් ලැබෙන බව මේ කතා සංකල්පයෙන් ඉදිරිපත් කරන්න මම උත්සාහ ගත්තා.''

බුද්ධිකගෙ අදහස රූපමාධ්‍යට නැගීමේ වගකීම පැවරෙන්නේ එන්ඩ්ලස් වර්ල්ඩ්(Endless World) හි මිලාන් කුරේට. මිලාන්ගේ අධ්‍යක්ෂණය සහ රංග බණ්ඩාර ගේ රූප රචනයෙන් සජීවීකරණය වෙන යාළු දැන්වීමට පොඩිත්තෙක් සහ සීයා කෙනෙක් හොයන්නත් බුද්ධිකලට තරමක් මහන්සි වෙන්න වෙලා.

පොඩිත්තා හොයද්දි අපි බැලුවෙ තරමක් දඟකාර ඇට්ටර ගතියක් තියෙන, ඒත් වැඩිහිටි බහට කීකරු වෙන තාලයේ පුංචි එකෙක්ව. අපි හිතුව විදිහෙ පුංචි එකෙක්ව අපිට ලැබුණා. ඔහු සනුක. සීයා මේ ක්ෂේත්‍රයට ආගන්තුකයෙක් නිසාම එකම දර්ශනය කිහිප වතාවක්ම ගන්න වෙලා. සීයා මිලාන්ගෙන් බැනුම් අහපු අවස්ථාත් ඕන තරම් තියෙනවා. ඒත් ඔහු බොහොම නිහතමානීව තමන්ගේ වගකීම ඉටුකරන්න ඉවසිලිමත් වුණු බව නොකියාම බැහැ. සීයාගේ චරිතයට පණ පෙව්වේ ගාමිණී.

මේකෙ රූපගත කිරීම් කළේ කොම්පඤ්ඤ වීදියේ සහ පිළියන්දල ප්‍රදේශයන් ආශ්‍රිතව. ඒ දවස් වල අඹ අවාරෙ නිසා හොඳ අඹ ගෙඩි දෙකතුනක් ගෙනැත් ප්ලාස්ටික් නැටිවල සවිකරල ගහේ හැදුණු අඹ නිර්මාණය කරන්නත් අපිට සිද්ධ වුණා. බුද්ධික එහෙම කිව්වෙ හිනාවෙවී.

කොහොම වුණත් කාගෙ කාගෙත් උත්සාහය තත්පර 45 සුන්දර දැන්වීමක් විදිහට නිර්මාණය වී එළි දකිද්දි රූපගතකිරීම් සඳහා ගතවුණු දිනදෙකක කාලයෙත් සංස්කරණ මැදිරියේ ගෙවුණු දින කිහිපයක වෙහෙස මහන්සියෙත් අමාරුකම් කාට කාටත් මේ වෙනකොට අමතක වෙලා❑

**සටහන – දහම්සා තිසරංගී**

අන් අයගේ කියුම් කෙරුම් ඔබට වැදගත් නොවේ.



# ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සංවර්ධනය කෙරෙහි ව්‍යවසායකත්වය වැදගත් වන ආකාරය

1. නව නිෂ්පාදන හෝ පවතින නිෂ්පාදිතයන් වැඩි දියුණු කිරීම නිසා ව්‍යාපාර අවස්ථා ජනිතවේ.
2. භූමිය,ශ්‍රමය හා ප්‍රාග්ධනය යන සාධක හිමියන්ට ආදායම් වැඩි කර ගැනීමට හැකියාව ලැබීමෙන් ඔවුන්ගේ වර්ධනයක් ඇති වීම.
3. ව්‍යවසායකයා ආරම්භ කරන ව්‍යාපාර නිසා තව තවත් අතුරු ව්‍යාපාර වර්ධනය වීම.
4. වෙළෙඳපොල තුළ පවත්නා දැඩි තරගකාරීත්වය තුළ රැඳී සිටීමට නම් නවෑතා බිහි කිරීමට අවශ්‍ය වේ. ඒ තුළින් ව්‍යාපාර වර්ධනය වේ.
5. වෙළෙඳපොළ ප්‍රසාරණය වීම තුළින් වෙනත් සේවාවන් හි වර්ධනයක් ඇති වේ.

### ව්‍යවසායකත්වයේ ප්‍රවණතා

❖ **කාන්තා ව්‍යවසායකත්වය (Women Entrepreneurship)**
නව්‍යතා සම්පාදනය සඳහා කාන්තාවන් යොමු වීම මින් අදහස් වේ. රූපලාවන්‍ය, කොණ්ඩා මෝස්තර දැමීම, කේක් ආකෘති නිර්මාණය ආදි සම්බන්ධයෙන් මොවුන් නවෝත්පාදනයේ නිරත වේ.

❖ **සාමාජීය ව්‍යවසායකත්වය (Social Entrepreneurship)**
පරිසර සංරක්ෂණය, සෞඛ්‍ය සේවා, ආපදා සහන ආදී ක්ෂේත්‍රයන්හි මෙසේ නවෝත්පාදන කටයුතු සිදුවේ. මානසික තෘප්තිය, සමාජ ප්‍රශංසාව, පිළිගැනීම, පරෝපකාරය යනාදී ප්‍රතිලාභ අපේක්ෂාවෙන් මෙවැනි ව්‍යවසායකයන් කටයුතු කරයි.

Eg :- දිළිඳු ජනතාව සඳහා ඇප සුරැකුම් නොමැතිව අන්‍යෝන්‍ය විශ්වාසය මත ණය පහසුකම් සැපයීමට බංගලාදේශයේ ග්‍රාමීන් බැංකුව ස්ථාපිත කළ නොබෙල් සම්මානලාභී මහාචාර්ය මොහොමඩ් යුනුස් මහතාය. ඔහු සාමාජීය ව්‍යවසායකයෙකි.

❖ **බහු ව්‍යවසායකත්වය (Multipreneurship)**
විශාල ආයතන සඳහා එකවර නව්‍යතාවන් රාශියක් හඳුන්වා දීම මින් අදහස් වේ. මෙහි දී ප්‍රධාන වශයෙන්ම සිදු වන්නේ නව ව්‍යාපාර කීපයක් ආරම්භ කරමින් මහා පරිමාණයෙන් කටයුතු කිරීමයි.

❖ **අභ්‍යන්තර ව්‍යවසායකත්වය (Intrepreneurship)**
ආයතනයක් තුළ විශේෂයෙන් විශාල සංවිධාන තුළ ඇතිවන ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම් මීට අයත් වේ. මෙහි දී ආයතනයේ සේවකයෝ නව නිපැයුම් (Innovation) ඉදිරිපත් කිරීමට ක්‍රියා කරයි. 'නව නිපැයුම්හි යෙදෙන සමාගම් සේවකයා ලෙස ද මෙය හැඳින්වේ.

### ව්‍යවසාය ව්‍යාපාරයක දැකිය හැකි ගති ලක්ෂණ

**ව්‍යවසාය ව්‍යාපාරයක දැකිය හැකි ගති ලක්ෂණ කිහිපයකි.**

1. **ලාභ ඉපැයීම හෝ නොඉපැයීම සඳහා පවත්වාගෙන යාම:-**
එනම් මුදල් ඉපැයීම හෝ සමාජ සේවය පදනම් කර ගනිමින් ව්‍යාපාර ඇරඹීමයි. රතු කුරුස සංවිධානය, සර්වෝදය, සිංහ සමාජය ආදිය සමාජ සේවය වෙනුවෙන් ආරම්භ කළ ව්‍යාපාර වලට නිදසුන් වේ.
2. **සුළු පරිමාණ හෝ මහා පරිමාණ වීම:-**
බහු ජාතික සමාගම් වැනි විශාල සමාගම්වල සිට කේවල ස්වාමි ව්‍යාපාර වැනි සුළු පරිමාණ ව්‍යාපාර දක්වා වූ ප්‍රමාණයන්ගෙන් සංවිධානය වීමයි.
3. **අවශ්‍යතාවය ඉටු කිරීමට නව නිෂ්පාදිතයක් බිහි කිරීම:-**
අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට කිසියම් භාණ්ඩයක් හෝ සේවයක් බිහි කිරීමයි.
4. **ප්‍රාදේශීය, දේශීය හෝ අන්තර් ජාතික වශයෙන් පැතිරීම:-** එනම් ග්‍රාමීය, ප්‍රාදේශීය, කලාපීය හෝ ගෝලීය වශයෙන් ව්‍යාප්තව තිබීමයි❑



සඳකැලුම් ජයතුංග,
ගණකාධිකාරී,
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්.

## සහෘද සංවේදනා එක්තැන් කළ පත් ඉරුව





## ඇස නැවතුණු තැන්

නැතිමුත් දෙඅත් පාවල ශක්තිය මෙමට
නැගුනෙමි යන්තරේ පණ ගන්වා උඩට
බාධක දෙබෑ වෙයි හැසිරෙන රිසකට
යන්තරෙ යටත් වී ඇත මගෙ අණ සකට

වැව් තාවුල්ලේ වෙල් යායන් සරු කරමින්
පුලතිසි පුරය රජ කරනට පිය උරුමෙන්
යුවරජු වන්න අයියණ්ඩිය පරදවමින්
මෙහෙවර කරමි යන්තරයක් හසුරුවමින්

අදහස - තිළිණ දිසානායක

## පහන් තරුව



හැමෝම
රඟපාලා...

මං දැනගද්දි
නාට්ටිය ඉවරයි....

ඒනිසා මම
ඉස්සර හිත මකලා
අළුතෙන්ම ලිව්වා.......

- නුවන් ගල්ගමුව



## මෙහෙවරට ආසිරි

සලසා සැමගෙ යහපත ජීවන මඟට
පිටු සරසමින් නෙක නෙක සිත් පහන් කොට
තතු පෙළ ගස්වමින් රට තොට දෙන අපට
මෙහෙවර නමට මේ ආසිරි කුසුම් මිට

මම ආලය කරමි කවදත් මෙහෙවරට
එනිසයි පිපුනෙ කවි කුසුමන් ඔබ නමට
පෙරදා ඉඳන් ඔබ හා මා බැඳි පෙමට
ලියවෙයි තවත් කවි මුතුවැල් දිනේ හෙට

දිරියෙන් ආම් මෙහෙවර වෙත අරන් කවි
ඇත දුරක අපි හමුවුනෙ නිසයි කවි
පාළුව කාන්සිය නිවුනේ නිසයි කවි
සරසම් සැමදාම ''මෙහෙවර'' මලින් කවි

**ඩී. ඒ. චාලට් විජයසිරි**
**සාමාජිකා - හොරණ ශාඛාව.**

### -- කසාවත --



බුදු බණ පදයක් අහන්න ආසයි
ඔබේ මුවින් මම
සවන් පුරා...
මිහිරි හඬින් කියනා ඒ,
බණ පද
රැව් පිළිරැව් දෙයි ගුවන පුරා...
පොඩි කහ සළුපට ඇඟ දවටාගෙන
පියවර මනිමින් මළුව පුරා...
සක්මන් කරමින්,
යන ඔබ දැක්කාම මම ද ඇදී එයි
බුදු සසුන කරා
කෙළි සෙල්ලම් කළ සෙල්ලම් පිටි අද
ඔබ නොමැතිව පාළු වෙලා
සෙල්ලම් මඟ හැර පන්සල් යන්නට
මුළු පවුලම අද පුරුදු වෙලා...
ගිහි ගෙයි හැරදා,
සිදුහත් කුමරු ගිය ලෙස
මව්පිය යහළුවෝ සැවොම දමා,
ඔබටත් එන්නට සිත දුන්නාදෝ
බුදු සසුනේ බුදු පුතෙක් වෙලා
කෙටි කර ගනිමින් සසර ගමන් මග
ඔබට නිවන් ලද හැකි වේවා,
සාදු සාදු මම බලාන ඉන්නම්,
පුදනට ගෙන ආ නිල් මහනෙල් මලක්
වෙලා...

**එච්. ජී. ටී. ඩී. හේවාවසම්**
**ජනක බණ්ඩාර දිසානායක -**
**පොළොන්නරුව ශාඛාව**

# ඔබ (නො)දන්න මම











# රැකියාව නිසා මට මගේ පවුලේ අය එක්ක ගත කරන්න ලැබුනේ ඉතා අඩු කාලයක්...

## - පද්මසිරි දයාවංශ
## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

**සම්පූර්ණ නම ෴-** රත්නායක මුදියන්සේලාගේ පද්මසිරි දයාවංශ

**උපන් දිනය (කැමති නම්) ෴-** ජූනි 26

**පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල ෴-** මගේ ගම පඩිවෙල, ඒක කුලියාපිටියෙ ටවුන් එකේ ඉඳලා කි.මී.10 දුරින් පිහිටි ගමක්. මම ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ බරාගෙදර මහා විද්‍යාලයෙන්. ගෙදර ඉඳන් ඉස්කෝලෙට පයින් යන දුර. 6 පංතියෙදි මම කුලියාපිටිය මහා විද්‍යාලයට ඇතුලත් වුණා. සාමාන්‍යපෙළ විභාගෙන් පස්සෙ මම උසස්පෙළ සඳහා කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළු වුණා. පාසැල් කාලෙදි මම බොහොම තැන්පත් ශිෂ්‍යයෙක්. හැම ගුරුවරයෙක්ම මට ආදරෙයි. ඒ කාලේ ඩබල් ප්‍රමෝෂන් කියලා ක්‍රමයක් ඉස්කෝල වල තිබුණා. අවසන් වාර පරීක්ෂණයේ ලකුණු අනුව ගුරුවරුන්ගෙ අනුදැනුම මත ඉස්කෝලෙ දක්ෂතම ශිෂ්‍යයින්ට එක පාර පංතිදෙකක් ඉහළට යන්න පුළුවන්. ඒ කියන්නේ තුනේ පංතියෙ ළමයෙක්ව හතරේ පංතියට නොදා පහේ පංතියට දාන්න පුළුවන්. එක ගමනක් බරාගෙදර විද්‍යාලයේ විදුහල්පති තුමා අපේ සීයාට කියලා තිබුණා ළමයාට ඩබල් ප්‍රමෝෂන් එකක් දෙන්න පුළුවන් කියලා. සීයා ඒකට කැමැති වෙලා නෑ. මගේ පාසැල් ජීවිතේ අවධින් තුනක් ගත කරපු මේ පාසැල් තුනටම මම කැමැතියි.

**විෂය ෴-** රසායන විද්‍යාව හැර අනිත් හැම විෂයයකටම මම කැමැතියි. මම උසස්පෙළ කළේ ගණිත අංශයෙන්. ඒ අතරම මම ඉංග්‍රීසි විෂයත් ආශාවෙන් හැදෑරුවා.

**ක්‍රීඩාව ෴-** මම පාසැලේදී මී.800 , 1500 දුර දිවීමේ ඉසව් ජයග්‍රහනය කළා. පස්සෙ කරාටේ ක්‍රීඩාවත් ඉතා ආශාවෙන් හැදෑරුවා. ඒ කාලේ මාත් එක්ක එකට කරාටේ ක්‍රීඩාව හදාරපු සමීපම යාළුවෝ කිහිපදෙනෙක් ජේ.වි.පී. කලබල කාලේදී මරා දැමූ සිද්ධිය මේ මොහොතේ මට මතක් වෙනවා.

**පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ ෴-** මට එහෙම ඉලක්කයක් තිබුණෙ නෑ. ඒ කාලේ අදටත් වඩා තරුණයින් රැකියා ප්‍රශ්නයෙන් පීඩා වින්දා.

**මුල්ම රැකියාව සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව ෴-** මම උසස්පෙළ කළේ 1978දී. උසස්පෙළ ප්‍රතිඵල අනුව මම ගණිත අංශයෙන් විෂයන් හතරම සමත්වෙලා තිබුණා. ඒ දවස්වලම කොමර්ෂල් බැංකුවේ සහ HNB බැංකුවේ ක්ලාක් කැෂියර් තනතුරට මම ඉල්ලුම් කළා. බැංකු දෙකේම විභාග වලට පෙනී හිටියට මට කැඳවීම ලැබුණෙ කොමර්ෂල් බැංකුවෙන්. 1979 මට මුල්ම පත්වීම ලැබුණේ මාතලේ ශාඛාවට. මාසෙ පඩිය රු1080 යි. මම බෝඩිමක නැවතිලා වැඩට ගියා. ඒත් ඒ ශාඛාව මගේ හිතට ඇල්លුවෙ නෑ. මේ අතරෙ HNB බැංකුවෙන් මට කැඳවීමේ ලිපියක් ලැබුණා. ඊට කලින් මට HNB එකෙන් කැඳවීමේ ලිපියක් එවලා තිබුණත් මොකක්දෝ අවාසනාවකට ඒක මට ලැබුණෙ නෑ. මම හරිම සතුටින් HNB එකට ගියේ. ක්ලාක් කැෂියර් කෙනෙක් විදිහට මුල්ම පත්වීම ලැබුණේ රත්නපුරේට. 1980 සැප්තැම්බර් වල ඉඳන් 2015 මැයි වෙනකල් මම HNB බැංකුවේ වැඩ කළා. ආයතනයේ පහළම තනතුරක ඉඳන් බැංකු නිළධාරී, විධායක, ශාඛා කළමනාකරු, ප්‍රාදේශීය කළමනාකරු, ජ්‍යෙෂ්ඨ හා ප්‍රධාන කළමනාකරු, සහකාර සාමාන්‍යාධිකාරී දක්වා ඉහළට ගමන් කරන්න මට හැකියාව ලැබුණා. මේ දේවල් ලබාගන්න මම හුගක් කැප කිරීම් කළා. මගේ වෘත්තීය සුදුසුකම් හදාගත්තා. අභියෝග වලට මුහුණ දුන්නා. හුගක් දුක් වින්දා. විශේෂයෙන් HNB එකේ පාඩු ලබමින් තිබූ ශාඛා ලාභ ලබන ඒවා බවට පත්කරන්න ඉහළ කළමනාකාරීත්වය තෝරා ගත් අයගෙන් කෙනෙක් මම. මේ නිසා මට මගේ පවුලේ අය එක්ක ගත කරන්න ලැබුනේ ඉතා අඩු කාලයක්. කොටින්ම බැඳලා අවුරුදු 13 ක්ම මට ගත කරන්න වුණේ ගෙදරින් පිට. එහෙම ඉඳලා කොළඹට පත්වීමක් ලැබිලා අවුරුදු කීපයකින්ම ආපහු දකුණු පළාත භාර ප්‍රාදේශීය කළමනාකරු විදිහට යන්න වුණා. මේ මොන අභියෝග ආවත් HNB බැංකුවේ ගතකරපු කාලය ඉතා සුන්දරයි. හරිම තෘප්තිමත්

**ජීවිතේ අමතක නොවන සිද්ධිය ෴-** 1992 මැයි 08 ඒ මගේ පුතා උපන් දවස. එදාම තමයි මට මුලින්ම මැනේජර් තනතුරක් ලැබිලා පොළොන්නරුව ශාඛාව ආරම්භ කළේ. එතැන ලොකු උත්සවයක්. කුළුදුලේ පුතෙක් ඉපදුන වෙලාවේ මට එතැන ඉන්න ඉන්න බැරිවීම ගැන බිරිඳට දුක හිතෙන එක සාධාරයිනේ.

**ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය෴-** ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණේ ලිපිකරු තනතුරකට HNB බැංකුවේ රැකියාවට ආපු මම පියවරින් පියවර ඉදිරියට ඇවිත් සහකාර සාමාන්‍යාධිකාරී ධූරයට උසස් වුණු දවසෙ... දුකට පත්වුණේ අනුන්ගේ වරදකට ටොප් මැනේජ්මන්ට් එක ඉස්සරහා MD (කළමනාකාර අධ්‍යක්ෂක) ගෙන් බැණුම් අහන්න වුණු දවසෙ. මීට කලින් මම කවදාවත් මගේ බොස් කෙනෙක්ගෙන් බැණුම් අහලා තිබුණෙ නෑ. අනික මම නොකළ වරදකට. එදා මම මගේ නිවැරදිකම වෙනුවෙන්වත් කතා නොකර නිහඬව හිටියේ ඇයි කියලා අදත් මම හිතනවා. ඒත් නැවතත් හිතෙනවා නිහඬව උන්නු එක වඩාත් හොඳයි කියලත්.

**අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව ෴-** පාසැල් කාලය, උසස් පෙළ පංතිවල ඉගෙනුම ලබපු කාලේ අපි හුගක් අධ්‍යාපනය වෙනුවෙන් මහන්සි වුණත් අපිට මග හැරුණු දේවල් තියෙනවා. ආයිත් ඒ යුගයට යන්න ලැබෙනවා නම් ඒ සමහර තැන් වෙනස් කර නිවැරදි කර ගන්න තිබුණා.

**ජීවිතයට අභිමි වුණු වටිනාම පුද්ගලයා හෝ අවස්ථාව ෴-** මට මගේ තාත්තගේ මග පෙන්වීම ආදරය ලැබුණේ ඉතාම අඩුවෙන්. පොඩිකාලේ මගේ හුගක් දේවලට මැදිහත් වුණේ සීයා. ඔහු තමයි මගේ ළඟින් හිටියේ. ඉන් පස්සේ මගේ වෘත්තීය ජීවිතයට විශාලම බලපෑම කළ පුද්ගලයා තමයි HNB බැංකුවේ රියෙන්සි විජේතිලක මහත්තයා. ඔහු හොඳ පියෙක්,ගුරුවරයෙක්, ඒ වගේම මිතුරෙක්. ඔහුගේ චරිතයෙන් අපිට ගන්න හුගක් පාඩම් තිබුණා. ඔහු උදාරතර අසාමාන්‍ය නායකයෙක්. මා මගේ වෘත්තීය ජීවිතයේ යම් සාර්ථකත්වයක් ලැබුවා නම් එහි සම්පූර්ණ ගෞරවය යායුත්තේ ඔහුට. මට තවත් කාලයක් ඔහුත් එක්ක සමීපව වැඩ කරන්න තිබුණානම්.....

**හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා ෴-** මම මගේ ජීවිතෙන් මගේ පවුලේ උදවිය වෙනුවෙන් වෙන් කරපු කාලය හුගක් අඩුයි කියන සිතුවිල්ල මා තුළ තියෙනවා. මුදල් අතින් සහ සැප සම්පත් ලබාදීම අතින් උපරිමය මා ඔවුන් වෙනුවෙන් කළත් ඔවුන් සමග ජීවිතය බෙදාගන්න මම වැයකළේ ඉතා අඩු කාලයක්. ඒ වෘත්තීය ජීවිතය වෙනුවෙන් හුගක් කැප කිරීම් කරන්න වුණු නිසයි. ඒත් මේ දුර්වලකම තවමත් හදා ගන්න මට පුළුවන් වෙලා නෑ..

**පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම ෴-** සාමාන්‍යපෙළ පංතියේ හිටපු ගෑණු ළමයෙක් ගැන මගේ හිතේ කැමැත්තක් තිබුණා. ඒ ළමයගෙ නම මට දැන් මතක නැති වුණත් ඒක මගේ පළවෙනි ආදර හැඟීම. අද වෙනතුරුත් ඒ ළමයාවත් නොදන්න ඒ අප්‍රකාශිත ආදර හැඟීම සැබෑ ආදරයක් විදිහට ප්‍රකාශයට පත්වුනේ වෙනත් ගැහැණු ළමයෙක් ළඟදී. මගේ පාසැල් මිතුරියක වූ ඇය අද වෙද්දි මගේ බිරිඳ වෙලා. ඇය ඉන්ද්‍රාණි ගුණතිලක

**ඇයගේ ඔබ දකින සුවිශේෂතාව ෴-** ඉතා ප්‍රබල චරිතයක්. පවුලට මගෙන් ඉටු නොවුණු සෑම යුතුකමක්ම අදටත් ඉටු වන්නේ ඇය අතින්. ස්වාධීනව හිතලා බොහෝ දේවල් කරන්න ඉන්ද්‍රාණිට ශක්තිය තියෙනවා. මම ලැබූ සෑම ජයග්‍රහනයකටම ඇයගෙන් ලැබුණු දායකත්වය විශාල පිටුවහලක් වෙලා තියෙනවා.

**ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද ෴-** ලැබී ඇති දේ අපමණයි.

**ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂ්‍යය (turning Point)෴-** ඇත්තෙන්ම මගේ ජීවිතය වුණේ රැකියාව. ඒක විවේචනාත්මක වෙන්න ඇති. ඒත් ඇත්ත ඒකයි. මගේ රැකියාවෙන් මම අපමණ ආශ්වාදයක් ලබනවා. තවමත් අදටත් එහෙමම තමයි. මගේ වෘත්තීය ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍ය තුනක් තියෙනවා. පෙළොන්නරුව සහ කෝට්ටේ ශාඛාවලත් දකුණු ප්‍රාදේශිකයේත් මා ලැබූ සාර්ථකත්වය මට ලොකු ගමනකට මාවත විවර කළා.

**ඔබේ ප්‍රියතම ගායකයා ෴-** විජය කුමාරතුංග මහතා

**ගීතය ෴-** රූපා ඉන්දුමතී මහත්මිය ගයන''මගෙ පුතුහරි හපනා''

**චිත්‍රපටිය ෴-** Taken

**කෘතිය ෴-** කරුණාසේන ජයලත් මහතාගේ ''ගැහැණු ළමයි''

**අනාගත ඉලක්කය ෴-** පසුගිය කාලය තුළ ගොඩක් අයට උදව් කරලා තියෙනවා. ඉදිරි කාලයෙත් තවත් පිරිසකට උදව් කරගෙන සතුටින් ජීවත්වෙන එක තමයි❑

සටහන
මංජුල හෙට්ටිආරච්චි

**අනුන්ගේ දියුණුව දැක සතුටු වීමෙන් තමාද දියුණුවට පත්වේ.**

**ස්වසංවර්ධන (SELF DEVELOPMENT) පිළිබඳ ලොව ලියවුණු පළමුසේම වඩාත්ම සාරගර්භ ග්‍රන්ථය ලෙසින් සැලකෙන්නේ ඩේල්කානගී විසින් රචිත HOW TO WIN FRIENDS & INFLUENCE PEOPLE ය. මුල් වරට 1937 දී ප්‍රකාශයට පත් කළ එම ග්‍රන්ථය දැනට විවිධ භාෂා 34 කට පර්වර්තනය වී තිබේ. ප්‍රථම මුද්‍රණයේ සිට මේ දක්වා වසර 78 ක් සපිරී තිබුණ ද තවමත් ඉහළම ඉල්ලුමක් ඇති ග්‍රන්ථයක් ලෙසින්ද මෙය වාර්තා වේ. දැනටමත් මෙම ග්‍රන්ථයේ පිටපත් 20,000,000 ක් ලොව පුරා අළෙවි වී තිබේ. ඩේල්කානගී මිය ගියේ 1955 දීය. ඔහු විසින් රචිත මෙම ග්‍රන්ථය මිනිසුන්ගේ සිත් දිනා ගැනීමට සේම මිනිසුන්ගේ හැසිරවීම් සම්බන්ධයෙන් පළවූ වඩාත් ප්‍රබල කරුණු ඇතුළත් ග්‍රන්ථය ලෙස සැලකේ.**

**ඩේල්කානගී විසින් රචිත HOW TO WIN FRIENDS & INFLUENCE PEOPLE ග්‍රන්ථයෙහි සිංහල පරිවර්තනයයි මේ.**





# සිත නොසන්සුන් මොහොතක ගන්නා තීරණ ඔබට බොහෝ දේ අහිමි කරයි....

ඇමරිකාවේ සිවිල් යුධ සමය ඇරඹිනි. ලින්කන් තම පොටොමැග් හමුදාවට නව ජෙනරාල්වරයෙකු පත් කළේ ය. ඔහු ජෙනරල් **මීඩ්** ය. ඊට පෙර සිටි ජෙනරල්වරුන් හේතුවෙන් ලින්කන්ට බලවත් අසීරුවකට පත් වන්නට සිදු විය. ඔවුන්ගේ අදක්ෂකම් පෙන්වා දෙමින් රටෙන් භාගයක්ම කිව්වේ අලුත් ජෙනරාල්වරයෙකු පත් කරන ලෙසිනි. එමෙන්ම හමුදා ප්‍රධානියා ලෙසින් **මීඩ්** පත් කිරීමට එරෙහිව මත භේද ද ඇති වූයේ ය.

**හැම දෙයක්ම කලින් නිගමනය කරන්න එපා. නිගමනය වන්න ඉඩ හරින්න.** ලින්කන්ගේ ප්‍රකට කියමන ජෙනරාල්වරයා පත් කිරීමට එරෙහිව මතු වූ මතවාද වෙනුවෙන් ද ඔහු කීය.

ප්‍රකට ගෙටිස්බර්ග් සටන 1863 ජූලි මුල් දින පැවතුණි. ජූලි මස 4 වන දිනයේ දී මහ වැසි සහ සුළං හමන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙසින් ලීගේ හමුදාව මහත් අසීරුවකට පත් වූයේ ය. ඔහු හමුදාව සමඟ පොටොමැග් වෙතට පැමිණියේ බොහෝ කනස්සළු ස්වභාවයෙනි. එහි වූ ගඟ උතුරා යමින් ද තිබූ හෙයින් එයින් එතෙර වීම බොහෝ අසීරු විය. සැබවින්ම ලීගේ හමුදාව මීඩ්ගේ හමුදාවට කොටුවී සිටියේ ය. ලින්කන් මෙය සිතුවේ දෙවියන් විසින් දුන් තිළිණයක් ලෙසිනි. මන්ද ලීගේ හමුදාවට කුමන හෝ අන්දමකින් පැන යෑම ගංවතුර හේතුවෙන් වැළකී තිබුණි. එහෙයින් මෙම අවස්ථාවෙන් නිවැරදිව ප්‍රයෝජන ගතහොත් ලීගේ හමුදාව යටත් කරගෙන යුද්ධයට විරාමයක් තැබිය හැකි බව ලින්කන්ගේ මතය වූයේ ය. එහෙයින් ලින්කන් ජෙනරාල් මීඩ්ට ටෙලිග්‍රාප් පණිවිඩයකින් දන්වා සිටියේ යුධ මණ්ඩලයට නොදන්වා වහා ලීගේ හමුදාවට පහර දෙන ලෙසිනි. එම පණිවිඩය කෙතරම් වැදගත් වීද යත් ලින්කන් විශේෂ පණිවිඩකරුවෙකු අතද එය මීඩ් වෙතට යවනු ලැබීය.

මීඩ් කරනු ලැබුවේ කුමක් ද? ඔහු ලින්කන්ගේ අණට සහමුලින්ම පිටුපාමින් පවතින තත්වය පිළිබඳව යුධ මණ්ඩලයට දන්වා සිටියේ ය. මීඩ් දෙගිඩියාවට පත්ව යුධ වැදීම කල් දැමීය. එසේ කිරීම සඳහා ඔහු විවිධ කාරණා ඉදිරිපත් කිරීමක් ද කළේ ය.

විශේෂයෙන් මීඩ් කියා සිටියේ අසරණව හිදින හමුදාවකට සෘජුව පහර දීම හමුදා ආචාර ධර්මයක් නොවන බවය. අවසානයේ ගං වතුර බැස ගිය හෙයින් ලී තම හමුදාව සමඟ පලා ගියේ ය.

**"දෙවියනි මේකා මොකද කළේ ? අපට ලීගේ හමුදාව සහමුලින්ම අල්ල ගන්න තිබුණා. ඔවුන්ගේ හමුදාවට මැරණය හැරෙන්න කිසිම දෙයක් ඉතිරිව තිබුණේ නැහැ. ඕනෑම දුර්වල ජෙනරල්වරයෙකු මේ විධියේ අවස්ථාවක දී කරන්නේ තම හතුරාව පරාජය කරන එකයි. මට මගේ අතින්ම ලීට කස පහර දෙන්න තිබුණා. ඒ හැම දෙයක්ම මීඩ් නැති කළා....."**

සිදු වූ වරද ලින්කන් කිසි විටෙකත් අනුමත කළේ නැහැ. ඔහු තම මන්දිරය දෙවනත් කරමින් කෑ ගසමිනි සිටියේ ය. අවසානයේ දී ලින්කන් තම ලියන මේසයෙහි හිදගත්තේ ජෙනරාල් මීඩ්ට දොස් පවරමින් ලිපියක් ලිවීමටයි. නමුත් මෙම කාලය වන විට දී ඔහු සියළු දේ පිළිබඳව මධ්‍යස්ථව සිතීමට පටන් ගෙන තිබුණි.

**හිතවත් ජෙනරාල් තුමනි,**

ලීගේ පැන යාම සම්බන්ධයෙන් ඔබ ඉදිරිපත් කරන කරුණු මං පිළිගන්නේ නැහැ. ඔහු සිටියේ අපේ ජයග්‍රහණය තුළය. අපට පහසුවෙන් ඔහුව අල්ලා ගැනීමට හැකියාව තිබුණි. අපේ පැරණි අතපසු වීම් ද අමතක කර යුද්ධය නිමා කරන්නට එයින් අපට ඉඩ ලැබෙනු ඇත. දැන් පවතින තත්වයට අනුව යුද්ධය දින වකවානු රහිතව දිග්ගැසුනි. පසුගිය සදුදින ලීට පහර නොදි සිටි ඔබ දැන් ගඟෙහි දකුණු දිගට ගමන් කරන ඔහුට පහර දෙතැයි සිතිය නොහැකිය. ලීගේ හමුදාවෙන් තුනෙන් දෙකක්ම ඔබේ අතට ගැනීමට ඉඩ තිබිණි. දැන් ඔබට යුද්ධය වෙනුවෙන් වැඩි යමක් කළ හැකියැයි මම විශ්වාස නොකරමි. අපට ලැබුණු රත්තරන් අවස්ථාව ඔබ මඟ හැරියේ ය. එයින් මම බොහෝ කලකිරීමට පත්වෙමි. එය ඔබ පිළිබඳ වූ අප්‍රමාණ කලකිරීමකි.

ලින්කන් විසින් පවරන ලද මෙම **"දෝෂාරෝපණ ලියමන"** කියවීමෙන් පසුව ජෙනරාල් මීඩ් කුමක් කරන්නට ඇතැයි ඔබ සිතන්නේ ද? ඔහු තම තනතුරෙන් ඉල්ලා අස් විය යුතුය.

නමුත් මේ ලියමන මීඩ්ට කියවන්නට ලැබුණේ නැත. එයට හේතුව ලින්කන් එය තැපැල් නොකිරීමය. මෙම හසුන අනෙක් අයට දක්නට ලැබුනේ ඔහුගේ මරණයෙන් ද පසුවය. ඒ ඔහුගේ ලිපි ගොනුවක සැගවී තිබිය දී ය. මීඩ් තම අණට අකීකරු වීම පිළිබඳ ලින්කන් පසු වූයේ දැඩි කෝපයකිනි. මන්ද එයින් බොහෝ දේ වෙනස්ව ගියේ ය. එහෙයින් මෙම ,දෝෂාරෝපණ හසුන, මීඩ් වෙත නොයැවීම ලින්කන් විසින් කළ අපූරු දෙයකි. ඔහු එසේ කිරීම සම්බන්ධයෙන් අපට එක්තරා දෙයක් සිතන්නට ඉඩ ලැබේ. එම ලිපිය ලියා හමාර කිරීමෙන් පසුව ඔහු ජනේලයේ එපිට පෙනෙන ලෝකය දෙස බලමින් මදක් කල්පනා කරන්නට ඇත. ඔහුට මෙවැනි දෙයක් සිතුණා විය හැක.

**කලබල වෙන්නෙපා. මොහොතක් සිතා බලන්න, ඕන දෙයක් මේක. මා මෙතරම් නපුරු වීම වැරදියි. ධවල මන්දිරයෙහි සුව පහසු අසුනක හිඳගෙන පහර දෙන්නැයි කියලා මීඩ්ට අණ කරන එක පහසුයි. මම ගෙටිස්බර්ග් වල උන්නා නම් මීඩ් ගිය සතියේ දුටුවා සේම ලේ ගංගාවක් මටත් දකින්නට ලැබෙනවා. මිය ගිය නැතිනම් තුවාල වූ සොල්දාදුවන්ගේ වේදනාකාරී හඬවල් වලින් මගේ දෙසවන් පිරී යනු ඇත. ඒ දෙස බලමින් මීඩ්ට වගේම මටත් ප්‍රහාරයක් එල්ල කරන්න නොසිතේවි. සමහරවිට මාත් මීඩ් ගත්තු තීරණයම ගනීවි. දැං ගංවතුර බැහැලා ගිහිං ලීගේ හමුදාව පැනල ගිහිනුත් හමාරයි. ඒ හින්දා මං දැන් මේ ලිපිය මීඩ්ට ඇරියොත් මීඩ්ට මගේ කෝපය මුසුවූ හැඟීම් දැන ගන්නට ලැබෙනවා. කොහොමත් මේ වෙද්දී ඔහු තමන්ගේ වරද සාධාරණීකරණය කරලා ඉවරයි. අන්තිමේ දී ඔහුගෙන් ලබන්න තියෙන ප්‍රයෝජනයත් මේ ලියුමෙන් නැති වෙලා යනවා.**

සමහර විට මේ ලියුම කියවපු ගමන්ම ඔහුට හමුදාවෙන් අයින් වෙන්නත් හිතේවි.,

බොහෝ විට ලින්කන් තමා විසින් ලියූ හසුන පැත්තකට විසිකර දැමුවේ එලෙසින් සිතුණ නිසා වීමට බැරිකමක් නැත. මන්ද මෙම කාලය වන විට දී විවේචනය කිරීම් හා උද්ඝෝෂණය කිරීම්වල අඳුරු මතකයන් රැසක්ම ලින්කන්ට තිබිණි. එය බොහෝ නිශ්ඵල දෙයක් ලෙස ඔහු දක්නට ඇත❑

**සිංහලයට නගන්නේ**

**වාසනා ලියනආරච්චි**

**පරාජය කියා දෙයක් නොමැතිබව තේරුම් ගැනීම සාර්ථකත්වයයි.**

HNB GRAMEEN මෙහෙවර 07
2016 ඔක්තෝබර් - නොවැම්බර්



HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරි චමින්ද ප්‍රභාත් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.



# ව්‍යාපාරයකට ණය මුදලක් නිකුත් කිරීමේදී ණය භාර නිලධාරීයාගේ අවධානයට ලක් විය යුතු කරුණු.

ක්‍ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයක් සඳහා ණය මුදලක් නිකුත් කිරීමට පෙර ණය භාර නිලධාරියා විසින් ව්‍යාපාරයේ ස්වභාවය පිළිබඳව නිවැරදි තක්සේරුවකට එළඹීම අත්‍යාවශ්‍යය වේ. ඒ සඳහා ඉවහල් කර ගත හැකි මූලික මිනුම් දඬු කිහිපයක් පිළිබඳව පසුගිය කලාපයෙන් අපි අනාවරණය කළෙමු. මෙවර අපගේ අවධානය යොමුවන්නේ ව්‍යාපාරයේ පැවැත්ම සඳහා බලපාන ප්‍රධානතම සාධක කිහිපයක් කෙරෙහි ණය භාර නිලධාරියාගේ අවධානය යොමු විය යුතු අන්දම පිළිබඳවය.

**Political** :ව්‍යාපාරය සඳහා වූ දේශපාලන බලපෑම කොයි ආකාරද යන්න පිළිබඳ ණය භාර නිලධාරියා තුළ වැටහීමක් තිබිය යුතුයි යන්න මින් අදහස් වේ. එනම් දේශපාලනික කාරණා මත මෙම ව්‍යාපාරය වැසී යාමට ඉඩ තිබේද නැතහොත් පවත්වාගෙන යාමේදී මතුවිය හැකි දේශපාලනික අවහිරතා මොනවාද යන්න පිළිබඳව යම් තරමකින් සොයා බැලීමක් ඔහු විසින් කළ යුතුය.

**Economic** : ආර්ථිකමය ගැටලු. එනම්, ව්‍යාපාරය සම්බන්ධයෙන් රට තුළ පවතින තත්වයන්. නිදසුනක් ලෙස ව්‍යාපාරය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය හෝ යන්ත්‍රෝපකරණ සඳහා පනවා ඇති බදු. ඒ සඳහා වන පිරිවැය. ව්‍යාපාරයේ පැවැත්ම සඳහා කරනු ලබන බලපෑම මෙහිදී නිරීක්ෂණය කළ යුතු වේ.

**Social** : ව්‍යාපාරයෙන් ඇතිවිය හැකි සමාජමය ගැටළු. කරගෙන යනු ලබන ව්‍යාපාරය හේතුවෙන් ශබ්ද දූෂණයක්, වායු දූෂණයක්, හෝ ජල දූෂණයක් සිදුවීමේ යම් ඉඩක් වේද, එමගින් පොදුවේ මිනිසුන්ට කිසියම් හානිකර තත්වයක් ඇති කරයිද ආදී කරුණු ගැන ණය භාර නිලධාරියා අවධානය යොමු කළ යුතුය.

**Technology** : ව්‍යාපාරය සඳහා අවශ්‍ය තාක්ෂණය කෙබඳු එකක්ද, එම තාක්ෂණය භාවිතා කිරීම සඳහා වූ දැනුම ව්‍යාපාරිකයා සතුද, නැතහොත් ඒ සම්බන්ධයෙන් ඔහු අනුගමනය කිරීමට බලාපොරොත්තු වන පිළිවෙත කෙබඳු එකක්ද

**Legal** : ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ නීතිමය තත්වයන් කෙබඳුද,එනම් එය නීත්‍යානුකූල ව්‍යාපාරයක්ද එය පවත්වාගෙන යාමේදී නීතිමය වශයෙන් එල්ලවිය හැකි බාධක සහ එම තත්වයන් ව්‍යාපාරය සඳහා කෙසේ බලපානු ඇත්ද යන්න පිළිබඳව සොයා බැලීමක් කළ යුතුය.

**Environment** : පරිසර තත්වයන්ගේ බලපෑම ව්‍යාපාරයට බලපානු ලබන අන්දම පිළිබඳව මෙහිදී සොයා බැලේ.නිදසුනක් ලෙස වැලි ගොඩ දැමීම පස් කැපීම වැනි ව්‍යාපාරයකදී එමගින් සිදුවිය හැකි පරිසර ගැටළු පිළිබඳ සොයා බැලීමක් කළ යුතුය.

**Competitor** : ව්‍යාපාරයට ඇති තරගකාරීත්වය, ණයලාභියා ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාරය හා සමාන, ඊට බලපෑම් කළ හැකි වෙනත් තරගකාරී ආයතන මොනවාද, ඒ තරගකාරී ආයතන විසින් ණයලාභියාගේ ව්‍යාපාරයට එක් කළ හැකි තරගය කෙබදු එකක්ද. එම තරගයට මුහුණ දීමේ ශක්තිය සහ ක්‍රමෝපායන් ඔහුගේ ව්‍යාපාරයන් සඳහා කෙසේ බලපානු ඇතිද යන්න අවදානයට ලක් කළ යුතුය.

**Plan** : ව්‍යාපාරයේ ඉදිරිය සම්බන්ධයෙන් ව්‍යාපාරිකයා සතු කෙටි කාලීන සහ දිගු කාලීන සැලසුම් මොනවාද? සැලසුමක් නොමැතිව පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයකින් වර්ධනයක් බලාපොරොත්තු විය නොහැකිය.

**Attitude** : ව්‍යාපාරය සම්බන්ධයෙන් ව්‍යාපාරිකයාගේ වූ ආකල්පය සේම ඔහුගේ පවුලේ උදව්ය මේ සම්බන්ධයෙන් දරනු ලබන ආකල්පය කෙබදුද යන්න ඉතා වැදගත්ය. නිදසුනක් ලෙස කාන්තාවක් විසින් අරඹනු ලබන ව්‍යාපාරයට ඇයගේ ස්වාමියා අකමැති නම් හෝ ඔහුගේ සහයක් ඊට නොලැබේ නම් ව්‍යාපාරයේ ඉදිරිය පිළිබඳව අපට දෙවරක් සිතීමට සිදුවේ.

## ව්‍යාපාරයේ ඇරඹුම

## Business Startup

යම්කිසි පුද්ගලයෙකු ව්‍යාපාරයක් ඇරඹීමට කටයුතු කිරීමේ අවස්ථාව නැතහොත් ව්‍යාපාරයට අඩිතාලම සකසන අන්දම අතිශය වැදගත් තීරණාත්මක අවධියකි. ව්‍යාපාරිකයා විසින් ව්‍යාපාරය සඳහා ණය මුදල් ඉල්ලා සිටින මේ අවධියේ අපට ව්‍යාපාරය පිළිබඳව සොයා බැලීමට දෘශ්‍ය මානයට හසුවන දත්ත සම්පූර්ණව නොමැති හෙයින් ණය ඉල්ලුම්කරු මූලික කර ගත් කරුණු කිහිපයක් ඔස්සේ ණය භාර නිලධාරියාට ණය මුදල් ලබා දීම හෝ නොදීම පිළිබඳව තීරණයකට එළඹීමට සිදුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ නිරීක්ෂණයට හසුවිය යුතු මිනුම් දඬු කිහිපයක් වේ. එය morfa ලෙස හැඳින්වේ.

### Morfa


**Market** - අදාල ණය ඉල්ලුම්කරු ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාරයට ඇති වෙළඳපොල ඉල්ලුම කෙබදුද. ඔහු එහි මිළ ගණන් නියම කරන්නේ කෙසේද, ව්‍යාපාරය පිහිටා තිබෙන ස්ථානය හා ඒ හා සම්බන්ධ වන අනෙකුත් භෞතික සාධක ඔහුගේ වෙළෙඳපොල තීරණය කිරීමේදී බලපානු ලබන අන්දම පිළිබඳව ණය භාර නිලධාරියාගේ පුළුල් නිරීක්ෂණයට හසු විය යුතුය.

**Objectives**
ඔහු විසින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාරය මාස හයකින් අවුරුද්දකින්, අවුරුදු පහකින් ආදී වශයෙන් ඔහුගේ ව්‍යාපාරයේ වියදම්, ආදායම් ඉපැයීම් සහ ව්‍යාපාරය ඉදිරියට මෙහෙයවන ආකාරය පිළිබඳව ණය භාර නිළධාරියාගේ අවධානය යොමු විය යුතුය.

**Resource** : ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ඔහු සතු කුසලතා හා ඔහු ඒ සඳහා බාහිරින් සපයා ගන්නා අනෙකුත් සාධක. නිදසුනක් ලෙස ව්‍යාපාරය සඳහා ඔහුට ශ්‍රමය අවශ්‍යනම් ඒ සඳහා පුහුණු ශ්‍රමිකයින් ඔහු සතු වේද? භාවිතා කරන යන්ත්‍රෝපකරණ කෙබඳු ඒවාද? ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා කායිකව මෙන්ම මානසිකවද ඔහු ශක්තිමත්ද යන කාරණා පිළිබඳව ණය භාර නිලධාරියා සැලකිලිමත් විය යුතුය.

**Financially** : මූල්‍යමය වශයෙන් ව්‍යාපාරයේ අපේක්ෂිත සාර්ථකත්වය කෙබදු එකක්ද, ව්‍යාපාරයෙන් ලැබිය හැකි ලාභය කෙබදුද. මේ ව්‍යාපාරයේම යෙදෙන වෙනත් තරගකාරී ව්‍යාපාරිකයින් ලබන ලාභය කෙබදුද. ඒ සඳහා අලෙවිය කොපමණ ප්‍රමාණයකින් තිබිය යුතුද,යන වියදම කොපමණද වැනි අංශ පිළිබඳව මෙහිදී සැළකිලිමත් විය යුතුය.

**Ability & Commitment** : ණය ඉල්ලුම්කරු ව්‍යාපාරය සම්බන්ධයෙන් දක්වන උනන්දුව සහ ඔහුට ඒ වෙනුවෙන් කොපමණ කැප කිරීමක් කළ හැකිද. ණය ඉල්ලුම්කරුගේ පෞරුෂය සහ චරිත ස්වභාවය ව්‍යාපාරයේ ඉදිරියට කෙබදු බලපෑමක් කරනු ඇතිද යන පුරෝකථනයන් ණය භාර නිලධාරියාගේ නිගමනයන්ට හා නිරීක්ෂණයන්ට බදුන් වීම අවධානමකින් තොරවූ ණය මුදලක් ලබා දීමට මඟහෙළි කෙරෙනු ඇත❑



අපට අවශ්‍ය පුද්ගලයා තව කෙනෙකු තුළින් දැකිය නොහැක.





# HNB ග්‍රාමීන් ශූර මෙවර ගාල්ල





















එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි සේවක සුබ සාධක සංගමය සහ ක්‍රීඩා සංගමය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන HNB ග්‍රාමීන් සභාපති කුසලාන මහා ක්‍රිකට් තරගාවලියෙහි අවසාන මහා තරගය පසුගිය සැප්තැම්බර් 03 වන දින කොළඹ 07 බ්ලූම් ෆීල්ඩ් ක්‍රීඩාංගනයේදී දවස පුරා අති උත්කර්ෂවත් ලෙස පවත්වනු ලැබුවා. ප්‍රාදේශීය මට්ටමින් තේරුණු ජයග්‍රාහී ක්‍රිකට් කණ්ඩායම් 20 සහ ප්‍රධාන කාර්යාලයේ ජයග්‍රාහී කණ්ඩායම් දෙකක් තරග වැදුණු මෙම තරගාවලියේ ජයග්‍රාහී කණ්ඩායමට හිමි HNB ග්‍රාමීන් අභියෝගතා කුසලානය HNB ග්‍රාමීන් ගාල්ල ශාඛාව විසින් දිනා ගනු ලැබු අතර අනු ශූරතාව HNB ග්‍රාමීන් අම්පාර ශාඛාව විසින් දිනාගනු ලැබුවා. තරගයේ වීරයා සහ තරගාවලියේ වීරයා සම්මානය ගාල්ල ශාඛාවේ ජනේෂ් විසින් හිමිකරගත් අතර හොඳම පන්දු යවන්නාට හිමි සම්මානය ගාල්ල ශාඛාවේ සසිඳු විසින් හිමිකරගත්තා. හොඳම පිතිකරුවාට හිමි සම්මානය අම්පාර ශාඛාවේ එච්.ආර්.එම්. ඉස්මත් විසින්ද හොඳම පන්දු රකින්නාට හිමි සම්මානය ගාල්ල ශාඛාවේ රවිඳු විසින්ද හිමිකරගනු ලැබුවා.

ක්‍රිකට් තරගාවලියට අමතරව මීටර් සියය දිවීමේ කාන්තා හා පිරිමි තරගද, බැලුම් පිපිරවීමේ තරගය සහ බැලුම් පිපිරවීමේ තරගයද, හොඳම විකට නරඹන්නා වැනි විනෝදාත්මක තරග ගණනාවක්ද සංවිධානය කර තිබීම තරගාවලියේ ආකර්ශනීය බව තීව්‍ර කිරීමට හේතු වුණා. පසුගිය වසරේදි මෙන් මෙවරද එච් එන් බී ග්‍රාමීන් අභියෝගතා කුසලාන මහා ක්‍රිකට් තරගාවලියේ ආකර්ශනීය බව වර්ධනය කිරීමට ඒ එච් එන් බී ග්‍රාමීන් කුමරා සහ කුමරිය තේරීමේ තරගය එක්කර තිබීම විශේෂත්වයක්.

"එච් එන් බී ග්‍රාමීන් සමාගමේ සහෝදරත්වයේ එකමුතුව සහ සංවිධාන ශක්තිය මේ තරගාවලිය පුරාම දැකිය හැකිවූ විශේෂත්වයක් බවත් වසරින් වසර මෙම තරගාවලිය වඩ වඩාත් උත්කර්ෂවත් ලෙස පවත්වන්නට එච් එන් බී ග්‍රාමීන් කණ්ඩායම් හැඟීම මනා පිටුවහලක් වූ බව අවසාන මහා තරගයේ සමාරම්භක මොහොතට

# යින්ගේ කුසලානය ල ශාඛාවට














එක්වෙමින් එච් එන් බී ග්‍රාමීන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා පැවසීය.තරගාවලියේ උත්කර්ෂවත්ම මොහොතවූ ත්‍යාග හා කුසලාන පිරිනැමීමේ අවස්ථාවට එච් එන් බී ග්‍රාමීන් සමාගමේ කළමනාකාර අධ්‍යක්‍ෂක චමින්ද ප්‍රභාත් මහතා, උප සභාපති බී. ප්‍රේමලාල් මහතා, අධ්‍යක්ෂිකා සඳමිණි පෙරේරා මහත්මිය සහ අධ්‍යක්ෂිකා ක්‍රිෂාන්ති තම්බයියා මහත්මිය ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වූහ.
































# HNB ග්‍රාමීන්හි අපේ ඉතුරුම, ආයෝජන අවස්ථාවන්ටත් මගහෙළි කරනවා




මම විවාහ වෙලා කන්තලේ පදිංචියට ඇවිත් අවුරුදු හතරක් වෙනවා.ඒ අතරෙ ගෙදර නිකන් ඉන්න නිසා මහත්තයත් එක්ක කතා කරලා මේ පොත් සාප්පුව පටන් ගත්තා.මහත්තයා තව පොත් සාප්පුවක් කන්තලේ ටවුන් එකේ කරන නිසා ව්‍යාපාරය පිළිබඳ යම් දැනුමක් මට තිබුණා.

මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුණේ 2015 අගෝස්තු මාසෙ ඉඳන්. ඒ HNB ග්‍රාමීන් ඉතුරුම් ගිණුමක් විවෘත කිරීමත් එක්ක. හොඳ පොළියක් වගේම අපි කවදත් දන්න කියන ආයතනයක් නිසා හොඳ සේවාවක් අපිට ලැබෙන බවත් අපි දන්නවා. මොකද සල්ලි තැන්පත් කරන්න වුණත් ග්‍රාමීන් සමාගම වෙත යන්න ඕනම නෑ.ග්‍රාමීන් එකේ නිළධාරී මහත්තුරු අපි ළඟටම ඇවිත් තැන්පතු මුදල් භාරගෙන රිසිට් පතක් ලබාදෙනවා. ග්‍රාමීන් සමාගමේ ඉතුරුම් ගිණුමක් හොඳින් පවත්වාගෙන ගිය නිසා කිසිදු ඇපයක් නැතිව මම ව්‍යාපාරය ආරම්භ කරපු වෙලාවෙ මට රු 50,000 ණය මුදලක් ස්වශක්ති ණය ක්‍රමයෙන් ලබාගන්න පුළුවන් වුණා. ඒ මුදලින් මම සාප්පුවට අවශ්‍ය උපකරණ මිළදී ගත්තා. සාප්පුවෙ ඉන්න අතරෙ පේපර් ආර්ට් නිර්මාණ සඳහත් මට යම් කාලයක් යොදවන්න පුළුවන්.ඒක අතිරේක ආදායම් මාර්ගයක්. ස්ව ශක්ති ණය ක්‍රමයෙන් ගත්තු පළවෙනි ණය මුදල ගෙවා අවසන් කරලා මම දෙවෙනියට රු.100,000 ණය මුදලක් ලබා ගත්තා.අපේ ඉතුරුම් මත පදනම් වුණු නිසා ස්වශක්ති ණය ක්‍රමයෙන් ණය මුදලක් ලබා ගැනීම පහසුයි වගේම අපිත් ඉතුරුම් සඳහා වැඩියෙන් උනන්දු වෙනවා.

**කේ. ජී. නිල්මිණී විජේවර්ධන**
**සේනානායක මාවත - කන්තලේ**

## ණය මුදල් නිසි කළමනාකාරීත්වයකින් යුතුව පරිහරණය කරනවා නම් ජීවිතය ජය ගන්න අපහසු නෑ.



මම ග්‍රාමීන් සමාගමත් එක්ක ගනුදෙනු කරන්න පටන් ගත්තෙ 2004 අවුරුද්දෙ ඉඳන්. ඒ කාලෙ මගේ ව්‍යාපාරය වුණේ පොල්කටු හැඳි නිෂ්පාදනය.ඉන් පස්සෙ තමයි ගඩොල් කැපීමේ ව්‍යාපාරය පටන් ගත්තෙ.මේ පළාතෙ කාලගුණයත් එක්ක දවාලෙ එළියෙ වැඩ කරන්න තරමක් අපහසුයි. ඒ නිසා හවස් වරුවෙ ගඩොල් කපන ව්‍යාපාරය කරලා දවාලට හැඳි හදනවා.මේ ව්‍යාපාර ආරම්භ කරන්න සහ පවත්වාගෙන යන්න අපිට උපකාර කළේ HNB ග්‍රාමීන් සමාගම. හදන ගඩොල් මිළදී ගන්න ගැණුම්කරුවො මෙහාටම එනවා.හැඳි නම් අපිම කඩවලට පොළවල් වලට අරන් ගිහින් විකුණනවා. ග්‍රාමීන් සමාගමෙන් මම රු30000 ඉඳලා 60000 දක්වා ණය මුදල් අරන් තියෙනවා. ණය ගන්නවා වගේම ඒ ණය මුදල් නිසි විදිහට නිසි කළමනාකාරීත්වයකින් යුතුව පරිහරණය කරනවා නම් අපිට ජීවිතය ජය ගන්න අපහසු නෑ.

**දිල්රුක්ෂි ඉනෝකා ප්‍රේමදාස**
**පේරමඩුව, අඟ්බෝපුර.**

## ව්‍යාපාරය දියුණු කරගන්න අවශ්‍ය සහය ග්‍රාමීන් සමාගමෙන් මට ලැබෙනවා.




මම ග්‍රාමීන් සමාගමත් එක්ක ගනුදෙනු කරන්නේ දැනට අවුරුදු දොළහක විතර ඉඳන්. ඒ දවස් වල මම කුළු බඩු නිෂ්පාදනය කළා. මුල් කාලේ රු.5000, 10000 වගේ ණය මුදල් ලබාගෙන ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන ගියා. ක්‍රම ක්‍රමයෙන් ව්‍යාපාරය දියුණු කරගෙන ඇවිත් අද වෙනකොට පුංචි කෑම කඩයක් පටන් අරන් පවත්වාගෙන යන මට්ටම දක්වා වර්ධනය කරගන්න මට පුළුවන් වුණා. ඒ අතරෙ කුළු බඩු නිෂ්පාදනයත් කරගෙන යනවා. කෑම ඇණවුම් ලබාගැනීමත් කරනවා.
HNB ග්‍රාමීන් දිරිය ණය ක්‍රමය අපි වගේ සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට ඉතා සහනදායී ණය ක්‍රමයක් වෙන්නෙ කණ්ඩායම් ක්‍රමය තුළ අපිට එකිනෙකාට ඇප වෙලා ඉතාම ඉක්මණින් සහ පහසුවෙන් ණය ලබා ගන්න පුළුවන් නිසා. දිරිය ණය ක්‍රමය ඇප ඉදිරිපත් කරන්න, වත්කම් පෙන්නන්න අසීරු අපි වගේ අයට ඉතාම හොඳ ණය ක්‍රමයක්. වසර ගාණක් පුරා අපි ග්‍රාමීන් සමාගම එක්ක ගනුදෙනු කරන්නෙ ඒ විශ්වාසය සහ පහසුව නිසයි.මේ වෙද්දි මම රු 70,000 ණය මුදලක් අරන් ව්‍යාපාරය තව ටිකක් පුළුල් කරලා පවත්වාගෙන යනවා. ව්‍යාපාරය තව දියුණු කරගන්න තමයි මගේ බලාපොරොත්තුව ඒ සඳහා අවශ්‍ය සහය ග්‍රාමීන් සමාගමෙන් මට ලැබෙනවා.

**බිල්ටා හෙට්ටිආරච්චි**
**බාතිය ගම, කන්තලේ**

## ව්‍යාපාරයේදී මතුවෙන ගැටළු වලට අපිට විසඳුමක් වුණේ HNB ග්‍රාමීන් සමාගම.



පොළොන්නරුව ධීවර ගම්මානයේ ජීවත්වන පවුල් අතරින් පවුල් අසූවකම පමණ ජීවිකා වෘත්තිය සරි කෙරෙනුයේ පරාක්‍රම සමුද්‍රය ඇසුරෙනි.වැව්මාළු, වැව් කරවල අලෙවිය ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වෙයි.

පරාක්‍රම සමුද්‍රයේ දැල් පන්න ක්‍රමයට මසුන් අල්ලන දමයන්ති මහත්මිය ග්‍රාමීන් සමාගමේ නිත්‍ය ගනුදෙනුකාරිණියක වනුයේ වසරකට පමණ ඉහත සිටය.

''අපි වැවේ ගිහින් මාළු අල්ලන රස්සාව කරන්නේ අවුරුදු ගණනාවක ඉඳන්, හවස දැල් එළලා පහුවෙනිදා උදේට දැල් අකුලනවා ඒ රාජකාරි කරන්නෙ පිරිමි උදවිය. අල්ලන මාළු දැල්වලින් බේරලා මාළු වලට විකුණලා තව කොටසක් කරවල වලට අයින් කරනවා. අපිට දැල් ආම්පන්න ගන්න ඔරු අළුත්වැඩියා කරගන්න වගේ වැඩ වලට අවශ්‍ය මුදල් හොයාගනිද්දි මතුවෙන ගැටළු වලට අපිට විසඳුමක් වුණේ HNB ග්‍රාමීන් සමාගම. මේ ගමේ ජීවත්වෙන පවුල් වලින් වැඩි පිරිසක් ග්‍රාමීන් සමාගමේ නිත්‍ය ගනුදෙනුකරුවන්. ණය ලබා ගැනීමේදී ඇති පහසුව වගේම හිතෛෂීවන්ත සේවාව HNB ග්‍රාමීන් සමාගම සමග අප සැමදා රඳවා තබා ගන්න සාධක.

**රෝස් දමයන්ති**
**ධීවර ගම, පොළොන්නරුව.**




# HNB ග්‍රාමීන් ශාඛාවක වගතුග

# ව්‍යාපාරික ඉලක්ක වලට එහා ගිය මානුෂික අරමුණක් අපිට තියෙනවා....

**-HNB ග්‍රාමීන් කන්තලේ ශාඛාව**

අධික ලෙස වියළී කර්කශ වූ මහපොළොව අධික සූර්ය තාපයෙන් දවන ලදුව වඩාත් හෙම්බත්ව ඇති සැටියකි. පෙරදා පිරී ඉතිරී තිබුණු කන්තලේ වැව එතෙක් අත්පත් කරගෙන හුන් බිම් සීමාවෙන් බොහෝ ප්‍රමාණයක් අතැර දමා ඉඩෝරයෙන් පරාජිත වී පසුබැස ගොස්ය. කන්තලේ වැව් තාවුල්ල දිගේ ඉදිරියට ඇදෙන අපගේ රියට වේගවත් වීමට අවසරයක් නැත. එක් පසෙකින් වූ කන්තලේ වැවත්, අනෙක් පසින් සැතපුම් ගණනක් දුරට විහිදුනු කෙත් යාය හා වතුපිටි වලින් සමන්විත දෑස් මානයට එකපැහැර හසු කර ගත හැකි දර්ශනයත් අපේ ගමන මන්දගාමී කර ඇත. කන්තලේ වැව පසුකර ප්‍රධාන වීදිය ඔස්සේ මද දුරක් ඉදිරියට ගමන් කරද්දී HNB ග්‍රාමීන් කන්තලේ ශාඛාව දෑස් මානයේ දිස්වේ.

කන්තලේ පුරවරයට ග්‍රාමීන් සමාගමේ ශාඛාවක ආගමනය සිදුවන්නේ 2004 වසරේ ජුනි 01 වනදාය. ඒ අංක 35 මහවීදිය කන්තලේ යන ලිපිනයටය. ග්‍රාමීන් ශාඛා ලැයිස්තුවේ 24 වන ශාඛාව වන කන්තලේ ශාඛාවේ මුල්පුටුව හොබවන්නේ කැලුම් නිලංග මහතා ය. අපි ශාඛාවේ වගතුග විමසන්නට ඔහු සම්මුඛ වූයේ ශාඛාවේ ව්‍යුහය ඔහු තරම් හොඳින් දන්නා තවත් අයකු නොවන හෙයිනි.

'මම 2003 අප්‍රේල් 21 ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුනේ ක්ෂේත්‍ර නිලධාරියෙක් විදිහට. ඉන් ටික කාලෙකට පස්සේ පොළොන්නරුව ක්ෂේත්‍ර කළමනාකරු විදිහට මට පත්වීමක් ලැබුණා. එතැන වැඩ කරන්න ලැබුණේ මාස තුනයි. කන්තලේ ශාඛාවේ ක්ෂේත්‍ර කළමනාකරුගේ පුරප්පාඩුවකට මට කන්තලේට පත්වීමක් ලැබුණා. 2009 මාර්තු වලදී මම කන්තලේ ශාඛාවේ කළමනාකාරධූරයට පත් වුණා.

කලින් මහවීදියේ තිබුණු කන්තලේ ශාඛාව 58/G ප්‍රධාන වීදිය කන්තලේ කියන අද ශාඛාව පිහිටුවා ඇති තැනට ගෙනාවේ 2013 නොවැම්බර් 07 වෙනිදා.

| මධ්‍යස්ථාන සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව | නිකුත් කළ ණය ප්‍රමාණය රු. |
|---|---|---|---|
| 111 | 2980 | 18 | රු. මි. 622 |

කන්තලේ කියන්නේ සිංහල ද්‍රවිඩ ජනතාව සියයට පනහට පනහ වගේ ජන සම්මිශ්‍රනයකින් සැදුම් ලත් ප්‍රදේශයක්. ඊට අමතරව මුස්ලිම් ජනතාවත් ඉන්නවා. මෙහේ වැඩි පිරිසකගේ ජීවනෝපාය වෙලා තියෙන්නේ ගෙවිතැන. එයිනුත් වී ගොවිතැන විශේෂයි. ඒත් ජන ඝණත්වය අතින් ගත්තාම අඩුයි. ඈතින් ඈතට විසිරිලා ගිය තත්වයකුයි එහි තියෙන්නේ. ගොවිතැනට අමතරව ධීවර වෘත්තිය ජීවනෝපාය කරගත්තු ජනකොටසක් කන්තලේ වැව ආශ්‍රිතව ඉන්නවා. ඒ වගේම මීකිරි නිෂ්පාදනය හේන් ගොවිතැන් බහුලව දකින්න පුළුවන්.

කන්තලේ ශාඛාව මඟින් මධ්‍යස්ථාන පවත්වාගෙන යන ප්‍රදේශය කන්තලේ ඉදන් ගත්තාම තඹලගමුව, ගල්ඔය, සේරුනුවර, මුත්තූර් කියන ප්‍රදේශවල සීමාවන් දක්වා විහිදෙනවා.

මේ පළාතේ ජීවත්වන වැඩි පිරිසක් ගොවිතැනෙන් ජීවත්වෙන පිරිසක් නිසා ණය වාරික නැවත අය කර ගැනීම කන්න අනුව කරන්න පුළුවන් නම් ඒක ලොකු පහසුවක්. මොකද මේ මිනිස්සුන්ගේ අතට මුදල් ලැබෙන්නේ වගාවල අස්වැන්න නෙලන කාලෙට. දිරිය ලෝන් වලටත් වඩා ඊසිලෝන් අභිලාෂ ස්වශක්ති ණය මුදල් වලට මේ පළාතේ සමහරුන්ගේ වැඩි ඉල්ලුමක් තියෙනවා.

අපි අපේ ගනුදෙනු කරුවන්ට ලබාදෙන මූල්‍ය සේවාවන්ට අමතරව ඔවුන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම, පුහුණුව, ලබාදීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලබනවා. ඒ වගේම අපි අපේ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කටයුතු වඩාත් හොඳින් කරගෙන යාම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සහ දිරිගැන්වීම නිරන්තරව සිදු කරනවා. ඔවුන්ට ලබා දී ඇති ඉලක්ක සම්බන්ධයෙන් සෑම දිනකම සවස යම් තක්සේරුවක් කරනු ලබනවා. දුර්වල සේවකයින්ගෙ අඩුපාඩු පෙන්වලා දීලා ඔවුන්ගේ වැරදි නිවැරදි කොට ඉලක්කය කරා යාමට අවශ්‍ය සහය ලබා දෙනවා.



HNB ග්‍රාමීන් කන්තලේ ශාඛාවේ නිළධාරි මණ්ඩලය

මේ වගේ විධිමත් වැඩපිළිවෙලක් තුළින් අපි අපේ දිගුකාලීන අරමුණු කරා ගමන් ගන්නා අතරම මූල්‍ය සමාගම් අතර තිබෙන තියුණු තරගකාරීත්වයටත් සාර්ථකව මුහුණ දෙනවා. මේ සියල්ල තුළින් HNB ග්‍රාමීන් සමාගමේ මුල් ශාඛා දහය අතරට ඒමයි කණ්ඩායමක් විදිහට අපේ බලාපොරොත්තුව❑

**සටහන - මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි**
**ඡායාරූප - ලක්ෂමන් කුමාරතුංග**



**ටී. ශ්‍රීකාන්තන්**
ප්‍රාදේශීය කළමනාකරු



**අජිත් ප්‍රියන්ත**
ප්‍රාදේශීය ගණකාධිකාරි



**කැළුම් නිලංග**
ශාඛා කළමනාකරු



**චරිත් සුරංග**
ශාඛා සහකාර කළමනාකරු



**ප්‍රදීප් සංජය**
ජ්‍යෙෂ්ඨ විධායක - මූල්‍ය සහ පරිපාලන



**පී. මයුරන්**
සහකාර කළමනාකරු - ක්ෂුද්‍ර මූල්‍ය

# HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලය මැලේසියාවේ සිව්දින සංචාරයක





HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් සිය කාර්ය මණ්ඩලය වෙනුවෙන් වසරක් පාසා සංවිධානය කරනු ලබන විදෙස් සංචාරය සිව් වන වතාවටත් සිය සේවකයින් 111 දෙනකු සඳහා මැලේසියාවේ සිව් දින සංචාරයක් ලෙස සැලසුම් කරනු ලැබුවේ පසුගිය අගෝස්තු 17,18,19,20 යන දිනවලදීයි. සේවකයින් තම වත්කම ලෙස වගේම ඔවුන්ට ජීවිතයේ සුවිශේෂී අවස්ථාවන් හිමිකර දීම තම යුතුකම ලෙස සලකන HNB ග්‍රාමීන් සමාගම ආයතනයේ වියදමින් මැල්සියාවේ සිව්දින සංචාරයක් සැලසුම් කළේ ආහාර පාන නවාතැන් පහසුකම් විතරක් නෙවෙයි මැලේසියාවේ සුවිශේෂී ස්ථාන නැරඹීමට යාම සඳහා අවශ්‍ය ගමන් පහසුකම් ද තම සේවකයින් උදෙසා සලසා දෙමිනුයි . මීට අමතරව මැලේසියාවේ ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමවේදය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ දැනුවත් බවක් කාර්ය මණ්ඩලයට ලබාදෙමින් මැලේසියාවේ ප්‍රමුඛ ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක් වූ Amanah Ikhtiar Malaysia හි අත්දැකීම් බෙදාහදා ගන්නට දිනයක කාලයක් වෙන්කර තිබුණා. මීට අමතරව මැලේසියාවේ "සන්වේ ලැගුන් (sun way lagoon) උද්‍යානයේ සහ මැලේසියාවේ ක්වාලාලාම්පූර් නගර සංචාරයේ දී ලැබූ ජාත්‍යන්තර අත්දැකීම් මැලේසියානු සංචාරය සඳහා සහභාගී වූ කාගෙත් ජීවිත වලට සුන්දර මතක සටහනක් වුණා.



නිරතුරුව ආයතනයේ උන්නතිය වෙනුවෙන් අවංක කැපවීමකින් යුතුව කටයුතු කරන තම සේවක මඬුල්ල වෙනුවෙන් තව තවත් සුබ සාධන සේවා රැසක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගම කටයුතු කරන බවත් එහි දිගුකාලීන අරමුණ වශයෙන් සේවක තෘප්තිය ඉහළින්ම අගයන, රැකියාව කිරීම සඳහා යෝග්‍යම ආයතන වශයෙන් ලංකාවේ මුලින්ම කියවෙන ආයතන තුන හතර අතරට HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගම ගෙන ඒමේ තම අරමුණ කරා සමාගම සීඝ්‍රයෙන් ළඟා වෙමින් සිටින බවත් මැලේසියානු සංචාරයට සහභාගී වීමෙන් පසු HNB ග්‍රාමීන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා මැලේසියානු සංචාරයෙන් පසු මෙහෙවරට පැවසුවා❑






# Atlas සිත්තර යාළු

## පුංචි අපේ චිත්‍ර පිටුව

''සිත්තර යාළු'' චිත්‍ර පිටුව වෙන්වෙලා තියෙන්නේ එච් එන් බී ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළි දැක්වීම පිණිසයි. ''සිත්තර යාළු චිත්‍ර පිටුවෙහි පළවන චිත්‍ර අතරින් **තෝරා ගනු ලබන හොඳම චිත්‍ර තුනක් සඳහා සිලෝන් පෙන්සිල් කොම්පැණි (ඇට්ලස්) මගින් පිරිනමනු ලබන වටිනා ත්‍යාග කට්ටල තුනක් පිරිනමනු ලබන** අතර ඔබගේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළිදක්වාලීමට ලැබෙන මේ මාහැඟි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන **ඔබේ දරුවාගේ චිත්‍ර නිර්මාණ සංස්කාරක, චිත්‍ර පිටුව, එච් එන් බී ග්‍රාමීන් ගොඩනැගිල්ල, අංක 168, නාවල පාර , නුගේගොඩ. යන ලිපිනයට නොපමාව යොමු කරන්න.**



වැඩිහිටියන්ට පිහිට වෙමු.
නේත්‍ර අභිමාණී දිසානායක - 6 ශ්‍රේණිය
(නිට්ටඹුව ශාඛාව.)



මුව රංචුව
ඉසුක අමෝධ්‍ය ද අල්විස් - 2 වසර
(ප්‍රියන්ත අල්විස් - ප්‍රධාන කාර්යාලය.)



අපේ පාසල් වත්තේ ශ්‍රමදානයක්
දිනිති ඉමාෂා අබේසේකර - 3 ශ්‍රේණිය
(රෝහණ අබේසේකර - වැලිමඩ ශාඛාව.)



මගේ සිහින කාරය
කෙමිත හිම්සර අබේවික්‍රම - 3 වසර
(සුරංග අබේවික්‍රම - ප්‍රධාන කාර්යාලය.)



බුදු වීම
සෙතික ඔමෙත් - 2 වසර
(ඕෂාන් පෙරේරා - ප්‍රධාන කාර්යාලය.)



මගේ නිවස
එම්. අකුෂා සෂිනි කුමාරතුංග - පෙර පාසල
(එම්. අමල් ප්‍රගීත් - හම්බන්තොට ශාඛාව.)



වැස්ස වහිනවා
එම්. ටී. උතුල් බුද්මිණ තංත්‍රිගේ - 2 ශ්‍රේණිය
(බුද්ධික තන්ත්‍රිගේ - ප්‍රධාන කාර්යාලය)



වනාන්තරය
එම්. කමීෂා ඕෂනි කුමාරතුංග - 2 වසර
(එම්. අමල් ප්‍රගීත් - හම්බන්තොට ශාඛාව.)

## ජූලි - අගොස්තු කලාපයේ පැණසර ජයග්‍රාහකයෝ

HNB ග්‍රාමීන් මෙහෙවර පුවත් සඟරාවේ ජූලි අගොස්තු කලාපයේ "පැණසර" ප්‍රහේලිකාව විසඳා එවා ජයග්‍රහණය කළ ජයග්‍රාහකයන්ගේ නම් පහත පළ වේ. සදීපා ප්‍රකාශකයන් විසින් පිරිනමනු ලබන රු. 3000 වටිනා පොත් කට්ටල නුදුරු දිනකදීම ඔබ වෙත ලැබෙනු ඇත. අපේ උණුසුම් සුබ පැතුම්...



ශානිකා මධුශානි
හොරණ ශාඛාව



එච්. සුරේන්
අවිස්සාවේල්ල ශාඛාව



ඩිශාන් සමින්ද
ප්‍රධාන කාර්යාලය

## ජූලි - අගොස්තු කලාපයේ ජයග්‍රාහී චිත්‍ර සඳහා තිළිණ දිනූ දූ පුතුන්

"Atlas සිත්තර යාළු"



කේ. එල්. දෙව්මි නතාශා පෙරේරා



එස්. ටී. පෙම්ලා සෙව්මි විහංසා



ඉනුකි සලින්සා

මෙහෙවර පසුගිය කලාපයන් දෙක වෙත චිත්‍ර ඇඳ එවූ දූ පුතුන් අතරින් තෝරාගත් චිත්‍ර සඳහා ඒවා ඇඳ එවූ දූ පුතුන් වෙත ඇට්ලස් සමාගම මඟින් ඉතා වටිනා ත්‍යාගයන් තිළිණ කරනු ලැබුවා. ත්‍යාග හිමි දූපුතුන් එම තිළිණ ලබාගැනීමෙන් අනතුරුව ඡායාරූපයකට මෙසේ පෙනී සිටිය අතර HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ සියළුම දූ දරුවන් වෙනුවෙන් වෙන්වූ **"ඇට්ලස් සිත්තර යාළු"** චිත්‍ර පිටුව වෙත ඔබගේ දුවගේ පුතාගේත් සිතුවම් එවන මෙන් අපි ඔබට කාරුණිකව මතක්කර සිටිනවා.

# මිනිසත්කම උතුරා ගැලූ දවසක්...

අමතක නොවන මතකයක්

අමතක නොවන මතකයක්... අද සිට අප අරඹන අළුත්ම විශේෂාංගයයි.ඔබේ ජීවිතයේ ඔබ මුහුණ දුන් රසවත් සිද්ධියක් අමතක නොවන මතකයක් ලෙස මෙහෙවර පුවත්පතේ සටහන් කරන්නට ඔබට පුළුවන්. ලියා එවන්න බැරි නම් 0710292120 ට ක්කක කරලා කිව්වත් කමක් නැහැ. ඔබේ අත්දැකීම අපි හැමෝගෙම ජීවිත එක්ක බෙදාගන්න කියලයි මේ ආරාධනය.

**ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය ලොව ඇරඹෙන්නේ දුප්පත් කම නසාලීමේ විසඳුමක් විදිහට. දුප්පත්කමින් මිරිකී බඩගින්නට ඇල්වතුර කෝප්පයක් බී කුස රවටා ගන්නා මිනිසුන් වෙසෙනා ලොවක බඩගින්නට ආහාර වේලක් සපයා දී තාවකාලික විසඳුමක් ලබාදෙනවා වෙනුවට කාටවත් අතනොපා ජීවත්විය හැකි දීර්ඝ කාලීන විසඳුමක් සැපයීම ග්‍රාමීන් සංකල්පයේ අරමුණ වුණා. මෙම අරමුණ ඔස්සේ ගෙවී ගිය කාලය පුරා අප අත්විඳී සතුටු මතක සේම කඳුළු මතකද අපමණයි.දුප්පත්කම විසින් තලාපෙලන ලද ජීවිත ඉන් මුදවාලනු පිණිස ගෙනයන අනවරත අරගලයේ එක් නිමේෂයකදී අපේ ක්ෂේත්‍ර නිළධාරියකු වූ වැලිමඩ ශාඛාවේ තිලක් බන්දුල මහතාට අත්විඳින්නට වූ ජීවන අත්දැකීමක් අප මෙසේ ඔබ හමුවට ගෙන එන්නේ ඉන් අපට ලද හැකි ආදර්ශ බොහෝ වන නිසයි.**

''වැලිමඩ ශාඛාව මගින් මෙහෙයවන ඵෑණුවත්ත මධ්‍යස්ථානයේ අපේ සාමාජිකාවකගේ ගෙදරට මම ගියේ ඇයගෙ ණය ආපසු ගෙවීම ටික දිනක ඉඳන් පැහැර හැරෙන බවක් දුටු නිසයි. සත්ව පාලනය සඳහා ණය මුදලක් ලබාසිටි අප සාමාජිකාවගේ සැමියාගේ අසනීප තත්වය හේතුවෙන් ඇයගේ ව්‍යාපාරය ක්‍රමයෙන් අඩාලවූයේ සැමියාගේ සහ දරුවන්ගේ සියළු කටයුතු ඇය කරපිට පැටවී තිබුණු නිසයි.මම ගෙදරට යනකොට පිළිකා රෝගයෙන් පෙළෙන ඇයගෙ මහත්තයා ගේ ඉදිරිපිට බිම ඉඳගෙන සිටියා.පිළිකා රෝගයෙන් පීඩා විඳිමින් සිටි සැමියාට වැඩක් පලක් කරන්න පුළුවන් තත්වයක් නැහැ.දරුවන් තිදෙනා ඇතුළු පවුලේ පස්දෙනකු යැපුනේ බිරිඳ විසින් තේ වත්තේ වැඩ කිරීමෙන් උපයා ගන්නා සොච්චම් මුදලකින්.සැමියාගේ බෙහෙත් සඳහා මුදල් සොයාගත නොහුණු තැන ගෙදර තිබූ පුටුව මේසය පවා විකුණා මුදල් සොයා ගැනීමට ඔවුනට සිදුවී තිබුණා. දහවල ගෙවී යමින් තිබූ ඒ මොහොතේ පසෙකින් වකුටු වී එක පොදියට නිදාසිටි අප සාමාජිකාව සහ ඇගේ කුඩා දරුවන් දුටු මා ඒ පිළිබඳව විමසා සිටියදී ඔහු පැවසුවේ ඔවුන් අසනීප ගතියෙන් පෙළෙන බවකි. එහෙත් සියල්ලන් එසේ එකවර අසනීප විය හැකිදැයි මා තුළ මතු වූණේ කුකුසක්. මා ඒ පිළිබඳව වැඩිදුර විමසීමේදී ඔහුගේ දෑසින් කඳුළු කඩා හැලුණේ එතෙක් සිත තුළ තද කරන් හුන් වේදනාව එසේ තව දුරටත් දරා ඉන්නට ඔහුට නොහැකි වූ නිසයි.බිරිඳ පසුගිය මාසයේ වත්තේ දළු කැඩීමට ගොස් උපයාගත් රුපියල් 790 ක වැටුප් වාර්තාව මාවෙත පෑ සාමාජිකාවගේ සැමියා මේ සල්ලි වලින් මාසයක් කන්නෙ කොහොමද සර් යනුවෙන් පවසද්දී ඔවුන්ගෙ කුඩාවුන් බිම වැටී නිදා ඉන්නා හේතුව වටහා ගැනීමට මට අසීරු වුණේ නෑ. ජීවිතයේ අනන්ත වූ දුක් සියල්ල එකට කැටි වී ඔවුන් පෙලනා සෙයක් මට දැණුනා.



මම නැවත ග්‍රාමීන් කාර්යාලට පැමිණ මා අත්දුටු සිදුවීම කළමනාකාරතුමන් ඇතුළු සහෝදර කාර්ය මණ්ඩලය හා පැවසුවේ ඇත්තෙන්ම එම සිදුවීම මා දැඩිලෙස කම්පාවට පත්කළ සිදුවීමක් නිසයි. මගේ කතාව ඇසු අප කාර්ය මණ්ඩලයේ සියළුම දෙනා මේ අසරණ දරු පවුලට හැකි අයුරින් උපකාරයක් කරමුයි එකඟ වූණේ ආපසු ඒ ගැන දෙවරක් සිතා නෙවෙයි.අනිකෙකුගේ දුක තමන්ගේ දුකක් ලෙස සළකා කටයුතු කරන ග්‍රාමීන් පිළිවෙත අදටත් අප අතර නොනැසී පවතින බව තහවුරු කරමින් අප කාර්ය මණ්ඩලයේ කිහිපදෙනා විසින් රුපියල් 13000 පමණ වූ මුදලක් මොහොතකින් එකතු කර දුන්නා. ඒ මුදලින් ඔවුනට අවශ්‍ය ආහාරපාන වර්ග මිළදී ගත් අප ඒවා ඔවුනට ගෙනගොස් දුන් මොහොත ග්‍රාමීන් ජීවිතයේ මට කිසිදිනෙක අමතකව නොයන මොහොතක් වූ බව නොකියාම බැහැ. අප ගෙන ගිය බිස්කට් පැකට් එවෙලේම කඩිමුඩියේ බෙදාගෙන කෑ පුංචි දරු පැටවුන් ගේ කෘතවේදී දෑස් සහ සතුටින් පිරුණු මුහුණු මේ දැනුත් මගේ දෑස් ඉදිරියේ මැවී පෙනෙනවා වගෙයි.



අප ගෙනගොස් දුන් ආහාරපාන තව දින කිහිපයක් ඔවුන්ගේ කුසගිනි නිවන්නට ඇති. එහෙත් තවත් වසර ගණනාවක් යනතුරුත් එයින් අප සිත් තුළ උපන් සතුට අපේ සිත් සතුටින් පුරවන පිංබර මතකයක් ව අපේ සිත්තුළ ජීවත්වේවි❑





**අප ගෙන ගිය බිස්කට් පැකට් එවෙලේම කඩිමුඩියේ බෙදාගෙන කෑ පුංචි දරු පැටවුන් ගේ කෘතවේදී දෑස් සහ සතුටින් පිරුණු මුහුණු මේ දැනුත් මගේ දෑස් ඉදිරියේ මැවී පෙනෙනවා වගෙයි.**

වැලිමඩ ශාඛාවේ තිලක් බන්දුලගේ මතකය
අකුරු කළේ - මංජුල

පිටුවෙන් ....
















## දැනුම වඩන්නයි - තෑගි දිනන්නයි මෙහෙවර පැණසර ප්‍රහේලිකා අංක - 03

**ජයග්‍රාහකයින් තිදෙනෙකුට සදීපා ප්‍රකාශකයෝ වෙතින් රුපියල් 3000 වටිනා පොත් කට්ටල තුනක්**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 ජේ | | | | | 2 | ■ | 3 |
| | ■ | ■ | 8 | | | | |
| 4 | | 5 | 7 ම | ■ | | ■ | |
| | ■ | | | | | ■ | |
| | ■ | | | ■ | | ■ | |
| ■ | ■ | 6 නි | | | ■ | 9 සා | |
| 11 | | | | ■ | 10 | | |
| 12 | | | | ■ | 13 | | ■ |

නම : .................................... සේවක අංකය : ...........................

ශාඛාව : .......................................... ප්‍රහේලිකාව පිරවුයේ වෙනත් අයෙකු නම් ඔහුගේ / නම : ..............................................

ඥාති සම්බන්ධය : ..........................................................

දිනය : ................................. අත්සන : ..................................

**උපකාරක, හරහට :-**

1 ලොව ප්‍රථම දෑත අහිමි ගුවන් නියමුවරිය ඇයයි.
4 "නගරය" යන්නට තවත් වචනයකි.
6 උපතින් හෝ ඉබේ පහලවන යන අරුත ඇති පදයකි.
8 දියෙහි පැද යා හැකි යාත්‍රා විශේෂයකි.
9 කඳු මුදුනක පිහිටි තැනිතලා බිම් පෙදෙස මෙනමින් හැදින්වේ.
10 කෙළවර යන අරුත දේ.
11 මාළු වියළා, සකස් කරගනී.
12 අභ්‍යාවකාශ තරණය සඳහා යොදාගනී.
13 සෙනසුරු ග්‍රහයාට තවත් නමකි.

**පහලට :-**

1 යේසුස් වහන්සේ උපන් ග්‍රාමය අයත් නගරය මෙනමින් හැඳින්වේ.
2 HNB ග්‍රාමීන් සමාගම ඉතුරුම් මත ලබාදෙන ණය විශේෂය මෙනමින් හැඳින්වේ.
3 "ග්‍රාමීන්" සංකල්පයේ නිර්මාතෘ ඔහුය.
5 වංශවත් කුලකාන්තාව මෙනමින් හැඳින්වේ.
6 බියසුළු ගති ඇති.
7 පසුම්බිය, කුඩා මල්ල යන අරුත ඇති වචනයකි.
9 බඩගින්නට තවත් වචනයකි.

මෙහෙවර පැණසර ප්‍රහේලිකාවේ බහුතරයක් උපකාරකයන් සැකසෙනුයේ මෙවර මෙහෙවර පුවත්පතේ පළව ඇති ලිපි වල අඩංගු කරුණු ඇසුරිනි. එම ලිපි කියැවූ ඔබට මෙම ප්‍රහේලිකාව පිරවීම කිසිසේත්ම අසීරු නොවනු ඇත. HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට මෙම තරඟය සඳහා සහභාගී විය හැකි අතර නිවැරදිව ප්‍රහේලිකාව පුරවා එවන්නන් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගන්නා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් තිදෙනෙකුට සදීපා පොත් ප්‍රකාශකයෝ වෙතින් අගනා පොත් පාර්සල් 3 ක් පිරිනමන අතර, ඔබගේ විසඳුම් ලබන මස 3 වන සතියට පෙර සංස්කාරක - මෙහෙවර පැණසර, HNB ග්‍රාමීන් අංක 168, නාවල පාර, නුගේගොඩ ලිපිනයට ලැබෙන්නට සලස්වන්න.

සම්මානලාභී බෞද්ධ, සාහිත්‍ය හා අධ්‍යාපන පොත් ප්‍රකාශකයෝ

සදීපා

• පොත් ප්‍රකාශනය • ප්‍රින්ට් හවුස්
• පොත් හල • ප්‍රින්ටර්ස්

Sole Agent in Sri Lanka
PELANGI Penerbitan Sdn. Bhd. Malaysia.

කුඩා ළමුන්ට මුල සිට සරලව ඉංග්‍රීසි ඉගෙනීම සඳහා මැලේසියාවෙන් ගෙන්වන Phonics පොත් පෙළ

සී/ස සදීපා ප්‍රකාශකයෝ
SADEEPA PUBLISHERS (PVT) LTD
1060, මරදාන පාර, බොරැල්ල

දුරකථන : 011-2686114, 2694289, 2678043
ෆැක්ස් : 011-2678044
Email : sadeepapub@gmail.com

අප හමුවේ ඇත්තේ අමාරුදෙය මිස කරන්න බැරි දෙය නොවේ.

# ළමා දිනය වෙනුවෙන් HNB ග්‍රාමීන් සමාගමෙන් පොළොන්නරුව කුඩාවැව විද්‍යාලයට ප්‍රදානයක්

ජාත්‍යන්තර ළමා දිනයට සමගාමීව HNB ග්‍රාමීන් සමාගම විසින් 2016 සැප්තැම්බර් මස 30 වෙනි දින පො/දිඹු/කුඩාවැව විද්‍යාලයේ දරු දැරියන්ගේ පරිහරණය සඳහා පාසැල් පොත්පත්, පුස්තකාල පොත්පත්, අඟල් 32 LED රූපවාහිනී යන්ත්‍රයක්, ශබ්ද විකාශන යන්ත්‍රයක්, ඇතුළු ද්‍රව්‍ය පරිත්‍යාග කරන ලදී.

පාසලේ විදුහල්පතිතුමන්ගේ ඉල්ලීම මත, මේ කුඩා දුෂ්කර පාසැල සඳහා නාමපුවරුවක් ලබාදීමද මෙම වැඩසටහනට සමගාමීව සිදුකරන ලදී. ඉතාමත් අවම පහසුකම් යටතේ පවත්වාගෙන යනු ලබන මෙම ප්‍රාථමික පාසලේ දරු දැරියෝ 90 දෙනෙක් පමණ අධ්‍යාපනය ලබති. එම දරු දැරියන් වෙනුවෙන් 'යාළු' ළමා ගිණුම් විවෘත කිරීමද මෙහිදී සිදුවිය. විදුහල්පති ඒ. ජී. බන්දුල රූපසිංහ මහතා පවසා සිටියේ තම පාසලට උදවු උපකාරකිරීමට ආයතනයක් ඉදිරිපත්වූ ප්‍රථම අවස්ථාව මෙය බවයි. මෙම දරුවන්ගේ දෙමාපියන්ද දැඩි දුෂ්කරතා මැද දිවි ගෙවන නිසා ඔවුන්ට පාසලේ සංවර්ධන කටයුතුවලට දායකවීම අපහසු ය. ලබන වසරේදී තමන් වෙනත් පාසලකට පත්වීම් ලැබීමට නියමිත බව සිහිපත් කළ ඒ මහතා එසේ නික්මයාමට පෙර මෙම පාසල වෙනුවෙන් හැකි උපරිමයෙන් මෙහෙවරක් ඉටුකිරීම තම අරමුණ බව පැවසී ය. මේ ආකාරයට තම පාසලේ උන්නතියට සුවිශේෂී ප්‍රදානයක් සිදුකිරීම වෙනුවෙන් HNB ග්‍රාමීන් සමාගමට සිය හද පිරි කෘතඥතාව පළකිරීමටද ඔහු අමතක කළේ නැත.

මෙම අවස්ථාවේදී අදහස් දැක්වූ බී. එම්. ඩී. සී. ප්‍රභාත් මහතා දරුවන්ට වටිනා ඔවදන් රැසක් ලබාදීමට කටයුතු කළේ ය. ජීවිතයේ අභියෝග ජයගත හැක්කේ හොඳ අධ්‍යාපනයක් ලැබීමෙන් බවපෙන්වාදුන් ඒ මහතා ඉදිරියේදීත් එම පාසලට අවශ්‍ය මොහොතක සහය ලබාදීමට පොරොන්දු විය. එමෙන්ම දිවයිනේ තවත් දුෂ්කර පාසල් රැසකට මෙසේ අත්වැලක්වීමට ඉදිරියේදී කටයුතු කරන බවද ඒ මහතා අවධාරණය කළේ ය.

HNB ග්‍රාමීන් තවත් ප්‍රජා සත්කාර වැඩසටහනක් ලෙස ක්‍රියාත්මකකරන ලද මෙම ප්‍රදානයන් සිදුකෙරුණු අවස්ථාවට HNB ග්‍රාමීන සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී බී. එම්. ඩී. සී. ප්‍රභාත් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගිවූ අතර, සෙසු ආරාධිතයන් ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී බිමල් සෙනෙවිරත්න, සහකාර සාමාන්‍යාධිකාරී පැතුම් සම්පත් කුරේ යන මහත්වරුන් ඇතුළු පිරිසක් එක්වූහ❑












## Happy Birthday

ඔක්තෝබර් - නොවැම්බර් මාස වල උපන්දිනය සමරන
එච් එන් බී ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත
අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමග පිරිනමමු !

| නම | දිනය | ශාඛාව |
|---|---|---|
| සුසන්ත චන්ද්‍රසිරි මහතා | ඔක්. 25 | කුරුණෑගල |
| ගයාන් මධුශංක මහතා | ඔක්. 25 | නුවර |
| කනිල් පෙරේරා මහතා | ඔක්. 26 | ප්‍රධාන කාර්යාලය |
| ප්‍රියන්ත කුමාර මහතා | ඔක්. 26 | නුවරඑළිය |
| ගීත් කනුෂ්ක මහතා | ඔක්. 28 | තිස්සමහාරාමය |
| සුරම්‍ය පුෂ්පක මහතා | ඔක්. 28 | පුත්තලම |
| නුවන් සමීර මහතා | ඔක්. 28 | හලාවත |
| සංජීව හෙට්ටිආරච්චි මහතා | ඔක්. 28 | අනුරාධපුර |
| යසින්ත දිල්රුක් මහතා | ඔක්. 28 | බණ්ඩාරවෙල |
| බී කවිනාත මහතා | ඔක්. 28 | මඩකලපුව |
| රෝහිත ඉංදික පීරිස් මහතා | ඔක්. 29 | මොරටුව |
| කවිදු කාංචන මහතා | ඔක්. 29 | නගර ශාඛාව |
| සසිදු සුදේශ් මහතා | ඔක්. 29 | ගාල්ල |
| දිලීප් කුමාර මහතා | ඔක්. 29 | නුවර එළිය |
| ප්‍රියන්ත ඩි අල්විස් මහතා | ඔක්. 30 | ප්‍රධාන කාර්යාලය |
| සුරංග දර්ශන හේරත් මහතා | ඔක්. 30 | මැදවච්චිය |
| රාජන් නිශාන්තන් මහතා | ඔක්. 30 | වවුනියා |
| එම්. නවචන්ද්‍රන් මහතා | ඔක්. 30 | මන්නාරම |
| ෂෙහාන් සංකල්ප මහතා | ඔක්. 30 | පුත්තලම |
| තිළිණ මධුශංක මහතා | ඔක්. 31 | බදුල්ල |
| චමීර ප්‍රියදර්ශන මහතා | ඔක්. 31 | බදුල්ල |
| තරිදු ගුණවර්ධන මහතා | ඔක්. 31 | හලාවත |
| බුද්ධි පියරංගන මහතා | ඔක්. 31 | මාතර |
| දිලීප් නුවන් මහතා | ඔක්. 31 | හලාවත |
| වීජිත කුමාර මහතා | ඔක්. 31 | කුරුණෑගල |
| චතුර ප්‍රදීප් මහතා | ඔක්. 31 | අවිස්සාවේල්ල |
| ප්‍රදීප් කුමාර ජයවර්ධන මහතා | නොවැ. 01 | නාවලපිටිය |
| මොහොමඩ් සෆ්රාස් මහතා | නොවැ. 01 | පොතුවිල් |
| ප්‍රදීප් කුමාර මහතා | නොවැ. 01 | බෙලිඅත්ත |
| එස් නිරුබන් මහතා | නොවැ. 01 | කිලිනොච්චි |
| සංජීව චතුරංග මහතා | නොවැ. 02 | නගර ශාඛාව |
| ධනුෂ්ක නදීශාන් මහතා | නොවැ. 02 | හලාවත |
| ජේ සුයන්ත් මහතා | නොවැ. 03 | වවුනියා |
| එම් ප්‍රසාත් මහතා | නොවැ. 03 | මුලතිව් |
| මධුශංක දිසානායක මහතා | නොවැ. 03 | මතුගම |
| දමින්ද රත්නායක මහතා | නොවැ. 03 | පදවිය |
| ප්‍රශාන්ත සම්පත් මහතා | නොවැ. 03 | පුත්තලම |
| හෂාන් මධුශාන් මහතා | නොවැ. 03 | අම්බලන්ගොඩ |
| ජී තිලකරත්න මහතා | නොවැ. 04 | නිකවැරටිය |
| ළහිරු ප්‍රනීත් මහතා | නොවැ. 04 | ගම්පහ |
| එන්. තනුරාජ් මහතා | නොවැ. 04 | කල්මුණේ |
| සඳරුවන් ජයරත්න මහතා | නොවැ. 05 | නාවලපිටිය |
| නඩරාජ් සුරේෂ් මහතා | නොවැ. 05 | වවුනියා |
| කෝකිලා සංජීවනී මෙනෙවිය | නොවැ. 05 | දඹුල්ල |
| කේ. පරමේෂ්වරන් මහතා | නොවැ. 05 | නෙල්ලිඅඩි |
| අකිල චතුරංග මහතා | නොවැ. 05 | නගර ශාඛාව |
| සුදේශ් පෙරේරා මහතා | නොවැ. 06 | ප්‍රධාන කාර්යාලය |
| කුමාර විතානගේ මහතා | නොවැ. 06 | හම්බන්තොට |
| රජිත පෙරේරා මහතා | නොවැ. 06 | මොරටුව |
| රසික ශාන්ත මහතා | නොවැ. 06 | මොරවක |
| ජේ. නිරෝෂන් මහතා | නොවැ. 06 | වවුනියා |
| ඉෂාර මධුශංක මහතා | නොවැ. 06 | වත්තල |
| දිමුතු දිලීප මහතා | නොවැ. 06 | ප්‍රධාන කාර්යාලය |
| මෙලන්ග මයිකල් මහතා | නොවැ. 06 | බදුල්ල |
| කුමාර රත්නායක මහතා | නොවැ. 07 | ගාල්ල |
| සමීර සම්පත් මහතා | නොවැ. 07 | නිකවැරටිය |
| චමෝද් අනුරාධ මහතා | නොවැ. 07 | නිට්ටඹුව |
| ගයාන් උදයලාල් මහතා මහතා | නොවැ. 07 | ගම්පහ |
| ඩිලාන් තරංග මහතා | නොවැ. 07 | හෝමාගම |
| තිළිණ මධුශාන් මහතා | නොවැ. 07 | හලාවත |
| ධනුෂ්ක චතුරංග මහතා | නොවැ. 08 | නගර ශාඛාව |
| චමිත් යසින්ත මහතා | නොවැ. 08 | මතුගම |
| චමිල හර්ෂප්‍රිය මහතා | නොවැ. 09 | බණ්ඩාරගම |
| චමින්ද දිසානායක මහතා | නොවැ. 09 | ගල්ගමුව |
| අජිත් කරුණාරත්න මහතා | නොවැ. 09 | පොළොන්නරුව |
| ඉඳුනිල් කුමාරි මෙනෙවිය | නොවැ. 09 | නිකවැරටිය |
| එස් යාලකන් මහතා | නොවැ. 09 | නෙල්ලිඅඩි |
| චන්දන කුමාර මහතා | නොවැ. 10 | මතුගම |
| සහන් මධුරංග මහතා | නොවැ. 10 | නිට්ටඹුව |
| නිලන්ත රත්නායක මහතා | නොවැ. 11 | ගල්ගමුව |
| ශෂී දුමින්ද මහතා | නොවැ. 11 | කන්තලේ |
| එන්. අරවින්දන් මහතා | නොවැ. 11 | නැදුන්කර්නි |
| චානක ජයතිස්ස මහතා | නොවැ. 12 | ප්‍රධාන කාර්යාලය |
| ඉංදික බණ්ඩාර මහතා | නොවැ. 12 | පොළොන්නරුව |
| සමීර ප්‍රසන්ගීත් මහතා | නොවැ. 12 | හෝමාගම |
| සුරේෂ් සේනානායක මහතා | නොවැ. 12 | ජා-ඇල |
| එස්. ඩෙනික්ශාන් මහතා | නොවැ. 12 | කල්මුනේ |
| නිශානී මධුෂ්කා මෙනෙවිය | නොවැ. 13 | හෝමාගම |
| ඒ ඩී එම් අනුරුද්ධික මහතා | නොවැ. 13 | පදවිය |
| ධනුෂ්ක මධුරංග මහතා | නොවැ. 13 | මොනරාගල |
| එස්.උලකේෂ්වරන් මහතා | නොවැ. 13 | මඩකලපුව |
| දිල්රුවන් කෝසල මහතා | නොවැ. 13 | මහියංගනය |
| රාසලිංගම් අලගේන්තරන් මහතා | නොවැ. 13 | කල්මුණේ |
| චන්දන ගයාන් මහතා | නොවැ. 14 | වත්තල |
| ශානක නිරෝෂන් මහතා | නොවැ. 14 | ප්‍රධාන කාර්යාලය |
| සංජීව වීරසිංහ මහතා | නොවැ. 14 | හම්බන්තොට |
| තුෂාර තිළිණ මහතා | නොවැ. 15 | ප්‍රධාන කාර්යාලය |
| ආර් ඒ ප්‍රභාත් මහතා | නොවැ. 15 | පොළොන්නරුව |
| චතුරංග මහේෂ් මහතා | නොවැ. 15 | මැදවච්චිය |
| රුවන් සම්පත් මහතා | නොවැ. 15 | බණ්ඩාරගම |
| සාරක මාඩිවිල මහතා | නොවැ. 15 | මාතර |
| මිලාන් ශාමික මහතා | නොවැ. 16 | අම්බලන්ගොඩ |
| නිමේශ් ප්‍රනාන්දු මහතා | නොවැ. 16 | මොරටුව |
| මංජුල ගමගේ මහතා | නොවැ. 16 | නොච්චියාගම |
| නෙවිල් සෙල්ව කුමාර් මහතා | නොවැ. 16 | නොරොච්චෝලෙ |
| ජී නිරෝජන් මහතා | නොවැ. 16 | මන්නාරම |
| අරුණ වසන්ත මහතා | නොවැ. 17 | ප්‍රධාන කාර්යාලය |
| කේ විනයාගමූර්ති මහතා | නොවැ. 17 | වවුනියා |
| ශානිකා මධුශානී මෙනෙවිය | නොවැ. 17 | හොරණ |
| කසුන් කල්හාර මහතා | නොවැ. 17 | කළුතර |
| වී විශ්වලිංගම් මහතා | නොවැ. 17 | කල්මුණේ |
| අකිල සඳරුවන් මහතා | නොවැ. 17 | හම්බන්තොට |
| ජයන්ත වීරසිංහ මහතා | නොවැ. 18 | මහියංගනය |
| ප්‍රදීප් රත්නායක මහතා | නොවැ. 18 | හෝමාගම |
| ජී සන්ශීත් මහතා | නොවැ. 18 | අම්පාර |
| ගිහාන් දිසානායක මහතා | නොවැ. 18 | බදුල්ල |
| නිමේෂ් සමන් මහතා | නොවැ. 18 | පදවිය |
| මලිත් කාවින්ද මහතා | නොවැ. 18 | මැදවච්චිය |
| චමින්ද ප්‍රදීප් මහතා | නොවැ. 19 | ඇඹිලිපිටිය |
| සුරාජ් මධුශංක මහතා | නොවැ. 19 | බෙලිඅත්ත |
| චන්දු වීරසිංහ මහතා | නොවැ. 19 | රත්නපුර |
| මිථිල පෙරේරා මහතා | නොවැ. 20 | ප්‍රධාන කාර්යාලය |
| හර්ෂණ ප්‍රසාද් මහතා | නොවැ. 20 | ප්‍රධාන කාර්යාලය |
| ආර් ප්‍රියන්තිකානි මෙනෙවිය | නොවැ. 20 | ප්‍රධාන කාර්යාලය |
| මංජුල හෙට්ටිආරච්චි මහතා | නොවැ. 21 | ප්‍රධාන කාර්යාලය |
| මධුෂා ගයානි මෙනෙවිය | නොවැ. 21 | ප්‍රධාන කාර්යාලය |
| නිම්සර සුපුන් මහතා | නොවැ. 21 | ගලෙන් බිඳුණුවැව |
| ප්‍රදීප් ධර්මසේන මහතා | නොවැ. 22 | අම්බලන්ගොඩ |
| භාතිය අමරසිංහ මහතා | නොවැ. 22 | ප්‍රධාන කාර්යාලය |
| දිල්ෂාන් ලක්ෂිත මහතා | නොවැ. 22 | නිට්ටඹුව |
| සංජය උපුල් බණ්ඩාර මහතා | නොවැ. 23 | ප්‍රධාන කාර්යාලය |
| උදාර සම්පත් මහතා | නොවැ. 23 | දඹුල්ල |
| දිලිනි සඳමාලී මෙනෙවිය | නොවැ. 23 | කුරුණෑගල |
| එස්. සුලක්ෂන් මහතා | නොවැ. 23 | කල්මුනේ |
| ප්‍රදීප් ඒකනායක මහතා | නොවැ. 24 | ගල්ගමුව |
| පැතුම් සම්පත් කුරේ මහතා | නොවැ. 25 | ප්‍රධාන කාර්යාලය |
| සනත් උදය බණ්ඩාර මහතා | නොවැ. 25 | ප්‍රධාන කාර්යාලය |
| සුදත් වීරසිංහ මහතා | නොවැ. 25 | ඇඹිලිපිටිය |
| ජී මයුරන් මහතා මහතා | නොවැ. 25 | කන්තලේ |
| නදීශා ලක්මාලී මෙනෙවිය | නොවැ. 25 | කළුතර |
| පී.රවීවර්මන් මහතා | නොවැ. 25 | කල්මුණේ |
| සුනේන්ද්‍ර මධුසංග මහතා | නොවැ. 26 | ප්‍රධාන කාර්යාලය |
| චතුර නුවන් මහතා | නොවැ. 26 | බදුල්ල |
| උදාර කවීන් මහතා | නොවැ. 26 | නුවර එළිය |
| කසුන් ලක්ෂිත මහතා | නොවැ. 26 | ප්‍රධාන කාර්යාලය |
| කේ . කජේන්තිරන් මහතා | නොවැ. 26 | කල්මුනේ |
| සචිත් එරංග මහතා | නොවැ. 27 | දඹුල්ල |
| චන්දන රණසිංහ මහතා | නොවැ. 28 | කුරුණෑගල |
| රංග ගුණසේකර මහතා | නොවැ. 28 | බණ්ඩාරගම |
| හෂාන් ඉංදික මහතා | නොවැ. 28 | හම්බන්තොට |
| තිළිණ රුවන් මහතා | නොවැ. 28 | අම්බලන්ගොඩ |
| එස්. බනූජ මෙනෙවිය | නොවැ. 28 | වවුනියා |
| සඳුන් කුමාර මහතා | නොවැ. 28 | අම්බලන්ගොඩ |
| කාංචන බෙලිකුඹුර මහතා | නොවැ. 29 | ප්‍රධාන කාර්යාලය |
| දිනේෂ් වාසුල මහතා | නොවැ. 29 | කෑගල්ල |
| චතුර නදීශාන් මහතා | නොවැ. 29 | කුලියාපිටිය |
| රජිත පෙරේරා මහතා | නොවැ. 29 | වෙන්නප්පුව |
| සශිනි අනුෂ්කා මෙනෙවිය | නොවැ. 29 | වෙන්නප්පුව |
| එස්. ප්‍රශාන්තන් මහතා | නොවැ. 29 | වවුනියා |
| ජේ. එම්. විදූෂාන් මහතා | නොවැ. 29 | වවුනියා |
| අසේල සමුද්දික මහතා | නොවැ. 30 | දඹුල්ල |

## ශිෂ්‍යත්වය සමත් අපේ දූ පුතුන්..

පසුගියදා ප්‍රතිපල නිකුත් වූ පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වූ දක්ෂයන් අතර HNB ග්‍රාමීන් සමාගමෙහි සේවයෙහි නියුතු අප කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දූ පුතුන් කිහිප දෙනෙකුන්ද වෙයි. HNB ග්‍රාමීන් ෆයිනෑන්ස් ලිමිටඩ් සමස්ත කාර්ය මණ්ඩලයේ සෙනෙහස් සුභාශිංසන සමගින් අපවෙත සිය ජයග්‍රාහනය දැනුම් දුන් ශිෂ්‍යත්වය සමත්වූ දූ පුතුන් කිහිප දෙනකුන්ගේ තොරතුරු අප මෙසේ පළ කරමු.



**එච්.එම්.එච්. දේවින්දි**
**ලබාගත් ලකුණු - 173**
(එච්.එම්. අජිත් අශෝක මහතා පොළොන්නරුව)



**ඩබ්.ඒ. චමෝද්**
**ලබාගත් ලකුණු - 170**
(ඩබ්.ඒ.කේ. ප්‍රියන්ක මහතා මහනුවර)



**ආර්.එම්. විනුජි**
**ලබාගත් ලකුණු - 170**
(ආර්.එම්. මහින්ද මහතා ප්‍රධාන කාර්යාලය)



**ටී.එච්. සිතුමිණ**
**ලබාගත් ලකුණු - 161**
(ටී. සුනන්ද මහතා ප්‍රධාන කාර්යාලය)

HNB GRAMEEN මෙහෙවර
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් ඃ 0112825843
ඊ-මේල් :- manjula.p@hnbgrameen.lk
වෙබ් :- www.hnbgrameen.com

අධීක්ෂණය :- චමින්ද ප්‍රභාත්
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- චින්තක (අර්ජුන ග්‍රැෆික්ස්)
මුද්‍රණය :- අර්ජුන ග්‍රැෆික්ස්, රත්තණපිටිය.
ඡායාරූප ශිල්පී :- ලක්ෂ්මන් කුමාරතුංග